# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2403/28 – 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා – 2024.09.25**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**නිවේදනයයි**

කඳුරට ප්‍රඥප්ති - 2024

2024 සැප්තැම්බර් 02 දිනැති සහ අංක 24/1672/611/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මලයාහ වතු ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික නිර්මිතය තුළට සම්පූර්ණයෙන් ඒකාබද්ධ කිරීම සඳහා මෙම "කඳුරට ප්‍රඥප්තිය" මූලික ලේඛනය ලෙස සම්මත කර ඇත.

එය මලයාහ වතු ප්‍රජාව සම්බන්ධයෙන් රජයේ වර්තමාන සහ අනාගත වැඩසටහන් සහ ප්‍රතිපත්ති සඳහා පදනම සහ මගපෙන්වීම විය යුතුය.මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ නිල ප්‍රකාශයට පත් කරන ලද ලේඛනයක් ලෙස මෙයින් දැනම් දෙනු ලැබේ.

**ජීවන් තොණ්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම්,
සංවර්ධන අමාත්‍ය.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය.

කොළඹ 03.

1A – G 42738 – 05 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# කඳුරට ප්‍රඥප්තිය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය

## අන්තර්ගතය


පූර්විකාව ....................................................................................................... 3

දැක්ම පිළිබඳ ප්‍රකාශය ....................................................................................... 4

දායකත්වය වෙනුවෙන් ලබා දෙන පිළිගැනීම ......................................................... 5

ජාතික කැපවීම ................................................................................................. 6

ඉඩම් සහ නිවාස ............................................................................................... 7

සේවා නියුක්තිය ................................................................................................ 9

ආර්ථික අභිවෘද්ධිය ........................................................................................... 11

සෞඛ්‍යය ........................................................................................................... 13

අධ්‍යාපනය ........................................................................................................ 15

ළමා සුබසාධනය සහ සංවර්ධනය. ...................................................................... 17

තාරුණ්‍යය සවිබල ගැන්වීම ............................................................................... 20

කාන්තා සවිබල ගැන්වීම සහ සමාජභාවී සමානාත්මතාවය ...................................... 23

අවදානමට ලක්ව ඇති කණ්ඩායම්වල පරිපූර්ණභාවය ............................................... 26

අනුස්මරණය සහ සංස්කෘතික සංරක්ෂණය ............................................................. 28

පූර්ණ පුරවැසිභාවය සඳහා පිළිගැනීම ලබාදීම සහ ප්‍රකාශයට පත් කිරීම .................. 29

නිගමනය .......................................................................................................... 30

## පූර්විකාව

ඉන්දියානු සම්භවයක් සහිත දමිළ (IOT) (**මලෙයාහ දමිළ**) වතුකර ප්‍රජාවගේ (**වතුකර ප්‍රජාව**) ශ්‍රී ලංකා ආගමනයේ 200 වන සංවත්සරය නිමිතිකොට ගෙන **මෙම ප්‍රඥප්තිය** සම්පාදනය කර ඇත.

**ඒ අතර,** ගත වූ ශත වර්ෂ දෙකක කාලය තුළ වතුකර ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික නිර්මිතිය තුළ ප්‍රමුඛ පෙළේ කාර්යභාරයක් ඉටුකර ඇති බව සඳහන්යි ශ්‍රී ලංකාව ලොව ප්‍රමුඛ පෙළේ තේ නිෂ්පාදකයකු බවට පරිවර්තනය කරමින් ජාතියේ ආර්ථිකයට සැලකිය යුතු මට්ටමකින් දායක වෙමින්, සහ ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව ඔසවා තැබීමෙහි ලා ඔවුන්ගේ අප්‍රතිහත කාර්යභාරය සහ කැපවීම උපකාර වී තිබේ.

**ඒ අතර,** වතුකර ප්‍රජාවගේ ශ්‍රම දායකත්වයෙන් දිවෙන තේ කර්මාන්තය, ආර්ථික සෞභාග්‍යය ලබා දීමට පමණක් නොව ශ්‍රී ලංකාවේ සමාජීය හා සංස්කෘතික භූ දර්ශනය හැඩ කරවීමට දායක වූ බව සඳහන්ය.

**ඒ අතර,** වතුකර ප්‍රජාවගේ සාම්ප්‍රදායන්ගෙන් අනූන උද්දීප්ත සංස්කෘතිය සහ ප්‍රත්‍යාස්ථිතිය, ශ්‍රී ලංකාවේ අනන්‍යතාවයේ අත්‍යාවශ්‍ය අංගයන් බවට පත්ව තිබෙන බව සඳහන්ය

**ඒ අතර,** ඉඩම්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් කරා ප්‍රවිෂ්ට වීම සඳහා පවතින සීමිත අවකාශය හමුවේ වතුකර ප්‍රජාව ඔවුන් විසින් ලබා දී තිබෙන අප්‍රතිහත දායකත්වය පසෙකලා ඓතිහාසික වශයෙන් ආන්තිකකරණයට ලක්ව ඇත බවට රජය විසින් හඳුනාගෙන තිබේ. මෙම ආන්තික කරණය විසින් දරිද්‍රතා චක්‍රයන් නිර්මාණය කර ඇති සේම සමාජීය වශයෙන් ඔවුන් බැහැර කර තිබෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පුළුල් ශ්‍රී ලාංකික සමාජය වෙත ඔවුන් ඔසවා තැබීම සහ පූර්ණ වශයෙන් ඔවුන් සමාජයට ඒකාබද්ධ කිරීම සඳහා ඇති අවස්ථා සීමා වී තිබේ.

ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රජාව විසින් ලබා දුන් දැවැන්ත දායකත්වයන් පිළිගැනීමට ලක්කිරීම සඳහා සහ ඓතිහාසික වශයෙන් ඔවුනට මුහුණපෑමට සිදු වූ දුෂ්කරතා සහ සිදු වූ අසාධාරණයන් නිවැරදි කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන කැපවීමක් ලෙස **මෙම ප්‍රඥප්තිය** සම්පාදනය වී තිබේ.

වතුකර ප්‍රජාව, අනෙකුත් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් මෙන් සමාන අයිතිවාසිකම්, අවස්ථා සහ ප්‍රතිලාභ භුක්ති විඳීම සහතික කිරීම සඳහා සහ ඔවුන්ගේ ජීවන තත්ත්ව නගා සිටුවීම සහ පූර්ණ වශයෙන් ඔවුන් සමාජයට ඒකාබද්ධ කිරීම සඳහා රාමුවක් සකස් කිරීම උදෙසා **මෙම ප්‍රඥප්තිය** සම්පාදනය වී තිබේ.

ඔවුන්ගේ පැරණි දායකත්වයන් පිළිගැනීමට ලක්කිරීම පමණක් නොව අනාගත පරම්පරාවන් සඳහා වඩාත් පරිපූර්ණ භාවයෙන් යුතු සහ යුක්තිසහගත සමාජයක් බිහි කිරීම සඳහා අවධානය යොමු කළ ලේඛනයක් ලෙස **මෙම ප්‍රඥප්තිය** ඉදිරිපත් කෙරේ.

වතුකර ප්‍රජාව, පිළිගැනීමට සහ ගරුත්වයට පාත්‍රවන සහ ජාතියේ සමාජ - ආර්ථික නිර්මිතිය වෙත අන්තර්ග්‍රහණය වන ප්‍රජාවක් මිස තවදුරටත් ආන්තිකකරණයට ලක්වන ප්‍රජාවක් නොවන බවට සහතික කිරීම සඳහා රජය දක්වන උනන්දුව නිල වශයෙන් ප්‍රකාශයට ලක්කරනු ලබන ලේඛනයක් ලෙස **මෙම ප්‍රඥප්තිය** සම්පාදනය වී තිබේ. මෙම ප්‍රඥප්තියේ සඳහන් මූලපිරීම් වෙත කැපවීම ඔස්සේ වතුකර ප්‍රජාව පූර්ණ වශයෙන්ම ජාතියේ සමාජ - ආර්ථික නිර්මිතිය වෙත අන්තර්ග්‍රහණය වන ප්‍රජාවක් මිස ආන්තිකකරණයට ලක්වන ප්‍රජාවක් නොවන බවට සහතික කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාන්විතයන් දියත් කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරයි.

සෑම පුරවැසියකුටම ඔවුන්ගේ පසුබිම කුමක් වුවද, දියුණුවීමට අවස්ථාව ඇති සාධාරණ හා යුක්තිසහගත සමාජයක් බිහි කිරීම උදෙසා රජය දක්වන කැපවීම පිළිබඳ සාක්ෂියක් ලෙස **මෙම ප්‍රඥප්තිය** සම්පාදනය වී ඇත.

## 1 පරිච්ඡේදය

### *දැක්ම පිළිබඳ ප්‍රකාශය*

වතුකර ප්‍රජාව අනෙකුත් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් මෙන් සමාන අයිතිවාසිකම්, අවස්ථා සහ ප්‍රතිලාභ භුක්ති විඳිම සහතික කරමින් ජාතියේ සමාජ - ආර්ථික නිර්මිතිය වෙත අන්තර්ග්‍රහණය වන ප්‍රජාවක් බවට පත්වන අනාගතයක් දැකීම ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාවයි. මෙම දැක්ම යුක්තිසහගත භාවයේ, අභිමානයේ සහ සවිබල ගැන්වීමේ න්‍යායන් මත පිහිටනු ලබන අතර, එමගින් ඔවුන් මුහුණ පෑ ඓතිහාසික අයුක්තීන් නිවැරදිකොට සෞභාග්‍යමත් සහ පරිපුර්ණ භාවයෙන් යුතු සමාජයක් බිහි කිරීම ඉලක්ක කරනු ලබයි.

මෙරට සෞභාග්‍ය සඳහා දායකවන සහ එය භුක්ති විඳින ප්‍රජාවක් ලෙස ජාතික අනන්‍යතාවයේ අත්‍යාවශ්‍ය අංගයක් බවට වතුකර ප්‍රජාව හඳුනා ගැනීම මිස ඔවුන් තවදුරටත් ආන්තිකකරණයට ලක්වන ප්‍රජාවක් ලෙස අර්ථනිරූපණය නොකිරීම රජයේ දැක්මේ ස්වභාවයයි.

පද්ධතිමය වශයෙන් සිදුවන වෙනසක් සඳහා වන අවශ්‍යතාවය හඳුනා ගැනීම ද මෙම දැක්මේ අඩංගු වේ. වතුකර ප්‍රජාව මුහුණ දෙනු ලබන ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා හුදෙක් මතු පිටින් දක්නට ලැබෙන ගැටලු කෙරෙහි මැදිහත් වීමෙන් ඔබ්බට විසඳුමක් අවශ්‍ය බව මෙම දැක්ම විසින් පිළිගනු ලබයි. ඒ සඳහා පරිපූර්ණ සහ සියලු පැති කඩයන් ආවරණය කරනු ලබන ඒ තුළින් අසාමානාත්මතාවය සහ නොසලකා හැරීම පිටුපස පවතින මූලාරම්භය ග්‍රහණය කරනු ලබන ප්‍රවේශයක් අවශ්‍ය වේ. ජාතික මට්ටමින් පවතින තීන්දු තීරණ ගැනීමේ ක්‍රමවේදවල පවතින ප්‍රතිපත්තීන්වලට ප්‍රතිසංස්කරණ එක්කිරීම, ආර්ථික සහ සමාජීය උන්නතිය උදෙසා නව අවස්ථා බිහි කිරීම සහ වතුකර ප්‍රජාවගේ හඬට සවන්දීම සහ ඊට ගරුත්වය ලබාදීම මීට ඇතුළත්ය.

වතුකර ප්‍රජාවගේ අනාගත පරපුරටයි. ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම පුරවැසියකුට පවතින සාර්ථකත්වය සඳහා ඇති සමාන අවස්ථා සහතික කිරීම සඳහා රජය කැපවී සිටියි. ගුණාත්මක අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, නිවාස සහ රැකියා අවස්ථා සඳහා පවතින ප්‍රවේශය මෙන්ම මෙරට සංස්කෘතික හා සමාජීය ජීවිතයට පුර්ණ වශයෙන් සහභාගි වීමේ හැකියාව මීට ඇතුළත්ය.

**2 පරිච්ඡේදය**

*දායකත්වයන් වෙනුවෙන් ලබා දෙන පිළිගැනීම*

ජාතියේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික නිර්මිතිය සඳහා වතුකර ප්‍රජාව විසින් ලබා දී තිබෙන අප්‍රතිහත දායකත්වයන් **ශ්‍රී ලංකා රජය නිල වශයෙන් පිළිගනු ලබයි.**

ශ්‍රී ලංකාව ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදකයන් අතරට ගෙන ඒම සහ ඒ තුළින් සැලකිය යුතු මට්ටමක විදේශ විනිමයක් උපයා ගැනීම සහ දහස් සංඛ්‍යාත පවුල්වල ජීවිකාවන්වල තිරසාරභාවය ඇති කරලීම සඳහා වතුකර ප්‍රජාව දායක වී ඇති බව **රජය පිළිගනු ලබයි.**

අද වනවිට ශ්‍රී ලාංකික සමාජයේ බොහෝ අංශ සෞභාග්‍යය භුක්ති විඳින්නේ, නිරතුරුවම පාහේ තමාට හිමිවිය යුතු පිළිගැනීම සහ ප්‍රතිලාභ පවා නොලැබ, වතුකර ප්‍රජාව සිය දහඩිය කඳුළු මතින් අප්‍රතිහත අන්දමින් ලබා දී ඇති නිමකළ නොහැකි වටිනාකමකින් යුතු ශ්‍රමය නිසාම බව **රජය පිළිගනු ලබයි.**

ආර්ථික ප්‍රගතිය සඳහා ලබා දී ඇති දායකත්වයෙන් ද ඔබ්බට, මලෙයහ දමිළ (IOT) ප්‍රජාව ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා සමාජීය භූ දර්ශනය පොහොසත් කළ බව ද **රජය පිළිගනියි.** ඔවුන්ගේ සාම්ප්‍රදායන්, උත්සව සහ සංස්කෘතික ක්‍රියාකාරකම් ජාතියේ විවිධත්වයෙන් යුතු සංස්කෘතික තිරය හැඩගැන්වීමට ප්‍රබල කාර්යභාරයක් ඉටුකර තිබේ. ශ්‍රී ලංකාවේ පුළුල් අනන්‍යතාවයේ කොටසක් ලෙස මෙම සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට සහ සැමරීමට රජය කැපවී සිටියි.

වතුකර ප්‍රජාව විසින් සැලකිය යුතු මට්ටමකින් ලබා දී තිබෙන සමාජීය දායකත්වය ද **රජය හඳුනා ගනු ලබයි.** අභියෝගාත්මක ජීවන තත්ත්ව පවතින සහ ඓතිහාසික අන්දමින් සමාජයෙන් බැහැරවීමකට ලක්ව ඇති පසුබිමක පවා විශිෂ්ට අන්දමින් ප්‍රත්‍යාස්ථිතියක් හා සහයෝගීතාවයක් ප්‍රක්ෂේපණය කිරීමට මෙම ප්‍රජාව සමත්ව තිබෙන අතර ඒ තුළින් ශක්තිමත් පවුල් හා ප්‍රජා සබඳතාවයන් පවත්වා ගැනීමටත්, ජාතියේ සමාජීය තිරය ගොඩනැංවීමටත් දායක වී තිබේ. මෙම ප්‍රජාව සමාජීය රාමුව වෙත පූර්ණ වශයෙන් ඒකාබද්ධ කරමින් අනෙකුත් පුරවැසියන්ට මෙන් සමාන අයිතීන් හා වරප්‍රසාද ලබා දීම සහතික කරමින් මෙම දායකත්වයට සිය කෘතඥතාවය පළකිරීමට රජය කැපවී සිටියි.

මෙම දායකත්වයන් බොහෝ අවස්ථාවන්වල දී නොසලකා හැර ඇති හෝ සුළුකොට තැකීමට ලක්කර ඇති බව **පිළිගන්නා රජය,** මෙමගින් එම ප්‍රජාව ක්‍රමානුකූල ලෙස අසමානතාවන්ට ලක්ව ඇති බව පෙන්වා දෙයි.

මෙකී වැරදි ක්‍රියාවන් නිවැරදි කොට වතුකර ප්‍රජාවගේ දායකත්වයන් පිළිගැනීමට ලක්කර ඔවුනට අර්ථවත් අන්දමින් ප්‍රතිලාභ ලබා දීම සඳහා වූ කැපවීමක් ලෙස මෙම ප්‍රඥප්තිය සම්පාදනය කොට තිබේ.

3 පරිච්ඡේදය

*ජාතික කැපවීම්*

වතුකර ප්‍රජාව විසින් ඓතිහාසික අන්දමින් මුහුණදෙනු ලැබූ සහ මුහුණදෙනු ලබන අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

මෙම කැපවීම් මුල් බැස තිබෙන්නේ වතුකර ප්‍රජාව ජාතියේ ආර්ථිකයට සහ සමාජීය හා සංස්කෘතික නිර්මිතියට ලබා දී තිබෙන දැවැන්ත දායකත්වය පිළිගැනීම තුළය.

වතුකර ප්‍රජාව සහ පුළුල් ශ්‍රී ලාංකික සමාජය අතර පරම්පරා ගණනාවක් මුළුල්ලේ පවතින සමාජීය හා ආර්ථික විෂමතාවයන් විසඳීම සඳහා පවතින හදිසි අවශ්‍යතාවය පිළිගැනීම දක්වා ද මෙම කැපවීම් මුල් බැස තිබේ.

වතුකර ප්‍රජාව සඳහා වූ දැක්ම යථාර්ථයක් බවට පත්කර ගැනීම උදෙසා පහත දැක්වෙන ප්‍රතිපත්තීන් හා මූලපිරීම් තවදුරටත් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

යුක්තිය, අභිමානය සහ වතුකර ප්‍රජාව පූර්ණ වශයෙන් ශ්‍රී ලාංකීය සමාජයට ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම කැපවීම් සම්පාදනය කොට ඇත.

## 4 පරිච්ඡේදය

### *ඉඩම් සහ නිවාස*

**4.1 ඉඩම් හිමිකාරීත්වය**

වතුකර ප්‍රජාව ජීවත් වූ ආකාරය පිළිබඳ ඓතිහාසික සන්දර්භය සැලකිල්ලට ගත්කළ ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ ගැටලුව අතිශයින්ම තීරණාත්මක වී තිබේ. දශක ගණනාවක් මුළුල්ලේ වතුකම්කරුවන් ජීවත්වූයේ වතු සමාගම් විසින් සපයා දෙන ලද ලයිම් කාමරවල වන අතර ඉන් ඔවුනට කිසිදු අන්දමක නෛතික හිමිකාරීත්වයක් ලබා දී නොමැත. එමෙන්ම, තම සේවා කාලය සඳහා රැකියා සුරක්ෂිතභාවයක් ද සපයා දී නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස රැකියාවෙන් නෙරපා දැමීමේ අවදානමකට ඔවුන් ලක් වී ඇති අතර ඔවුන් අතර දරිද්‍රතා හා යැපුම් චක්‍රයක් නිර්මාණය වී ඒ යටතේ ජීවත්වීමට ඔවුනට සිදුව ඇත.

සෑම වතු කම්කරු පවුලකටම පදිංචිය සඳහා ඉඩම් කොටසක් ලබා දීමට රජය කටයුතු කරනු ඇත. මෙසේ ඉඩමක් වෙන් කිරීම ජීවත්වීම සඳහා හුදෙක් භෞතික අවකාශයක් ලබා දීමටත් වඩා ඔවුන්ගේ යටගිය අභිමානය යළි නඟා සිටුවීමේ පියවරක් වන අතර, එමගින් ඉඩමකට හිමිකම් කීමට තිබෙන අයිතිය බොහෝ කාලයක් මුළුල්ලේ අහිමි වූ ප්‍රජාවකට අයිතියේ හැඟීම යළි ඇති කරවීම අපේක්ෂා කරනු ලබයි.

වතුකම්කරුවන් සතුව දැනටමත් පවතින ඕනෑම ඉඩම් බලපත්‍රයක් සින්නක්කර ඉඩම් ඔප්පු බවට පත් කිරීමේ යාන්ත්‍රණයක් ද ස්ථාපිත කරනු ඇත.

ඉඩම් හිමිකාරීත්වය මූලික අයිතිවාසිකමක් වන අතර ආර්ථික සවිබල ගැන්වීම සඳහා තීරණාත්මක පියවරක් වේ. එමගින් පවුල්වලට සුරක්ෂිත නිවාස තනා ගැනීමට, තමන්ගේම බෝග වගා කිරීමට, අමතර ආදායම් උත්පාදනය ප්‍රවර්ධනය කිරීමට සහ අනාගත පරපුරට ස්ථාවර පදනමක් නිර්මාණය කිරීමට ඉඩ සලසනු ලබයි.

ඉඩම් හිමිකාරීත්වය ලබා දීම තුළින් දරිද්‍රතා හා යැපුම් චක්‍රය බිඳ දැමීමට සහ ප්‍රජාවට ඉහළ ආර්ථික හා සමාජීය ස්වාධීනත්වයක් ලබා ගැනීමට අවශ්‍ය ඉඩප්‍රස්තාව සපයා දීමට රජය කැපවී සිටියි.

තවද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් වතු ක්ෂේත්‍රය තුළ බොහෝ කාලයක් මුළුල්ලේ පවතින අති ජනාකීර්ණභාවය හා අවිධිමත් නිවාස පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය වනු ඇත. සෑම පවුලකටම ඉඩම් කොටසක් ලබා දීම තුළින් වඩාත් ඉඩකඩ සහිත, අභිමානයෙන් ජීවත්විය හැකි නිවෙස් තනා ගැනීමට රජය විසින් ඉඩ සලසා දෙනු ඇත. මෙමගින් ජීවන තත්ත්ව ඉහළ යන අතර යහපත් සෞඛ්‍යය සහ ප්‍රජාව අතර යහ පැවැත්ම ප්‍රවර්ධනය වනු ඇත.

**4.2 නිවාස**

බොහෝ වතු කම්කරුවන් ජීවත්වන්නේ පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ විදුලිය වැනි මූලික අවශ්‍යතාවයන්වත් සපුරා නොමැති ගරා වැටුණු අඩමානේ පවතින නිවෙස්වලය (ලයිම් කාමර). මෙමගින් ඔවුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ පොදුවේ යහ පැවැත්මට දරුණු බලපෑමක් එල්ල වී තිබේ.

ලයිම් කාමර වෙනුවට අභිමානයෙන් ජීවත්විය හැකි නිවාස ඒකක තැනීම සඳහා පරිපූර්ණ නිවාස ප්‍රතිපත්තියක් සම්පාදනය කෙරෙනු ඇත. මෙම නව නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනෙනුයේ පෞද්ගලික මූල්‍ය මාර්ග, රජයේ අරමුදල් හෝ රජයේ අනුග්‍රහය ලද ණය පහසුකම් ඔස්සේ වන අතර, එකී නිවෙස්වලට පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ විදුලිය වැනි අත්‍යවශ්‍ය සේවාවන් සපයනු ඇත. එමෙන්ම මෙම නිවාස ඉදි කෙරෙනුයේ කඳුකර කලාපයේ පැන නැගී තිබෙන පාරිසරික අභියෝගවලට ඔරොත්තු දිය හැකි පරිදිය. වතු කම්කරුවන් වෙත පැනවෙන බර අවම කිරීම සඳහා ඔවුන් සේවය සපයන වතු ආසන්නයේ මෙම නිවාස ඒකක ඉදිකිරීම සහතික කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

වතුකර ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා නව නිවාස ඒකක ඉදිකිරීම අත්‍යවශ්‍ය බව රජය විසින් හඳුනාගෙන තිබේ.

4.3 ජනාවාස ගම්මාන බවට පරිවර්තනය කිරීම

දශක ගණනාවක් මුළුල්ලේ වතුකර ජනාවාස පැවතියේ වතු සමාගම්වල පාලනය යටතේ පවතින සීමාවකට යටත් තනි භූමි ප්‍රදේශවල වන අතර, එමගින් එකී ජනාවාසවලට ජාතික සංවර්ධනයේ ප්‍රතිලාභ භුක්ති විඳීමට ඇති නිදහස අහිමි වී ගොස් තිබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රජාවට සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ යටිතල පහසුකම් ආදී අත්‍යවශ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය සීමිත වූ අතර එය ඔවුන් තවදුරටත් ආන්තිකකරණය වෙත ඇද දැමුවේය.

දැනට වතුවල පවතින ජනාවාස පිළිගනු ලැබූ සහ තිරසාර ගම්මාන බවට පරිවර්තනය කිරීම සඳහා රජය කැපවී සිටියි. මෙම මුලපිරීම ඔස්සේ එකී ජනාවාසවල පාලනය වතු සමාගම්වලින් ඉවත් කරනු ඇති අතර එකී ගම්මාන ජාතික පරිපාලන රාමුව වෙත අන්තර්ග්‍රහණය කරනු ඇත. ඒ තුළින් නිවැසියන්හට රජයේ සේවාවන් සහ යටිතල පහසුකම් සඳහා පූර්ණ ප්‍රවේශය සැපයෙනු ඇත. මෙමගින් පිරිසිදු ජලය, සනීපාරක්ෂාව, විදුලිය, මාර්ග සහ පොදු ප්‍රවාහන සේවය මෙන්ම රජයේ පාසල් සහ සෞඛ්‍ය සේවා පහසුකම් ආදී පහසුකම් වෙත ප්‍රවේශය සැපයෙනු ඇත. මෙකී ජනාවාස ජාතික පරිපාලන රාමුව වෙත අන්තග්‍රහණය කිරීම තුළින් නිවැසියන්හට ඉහළ දේශපාලනික නියෝජනයක් සහ ආභාසයක් ලබා ගත හැකි අතර එමගින් තම අයිතිවාසිකම් සහ අවශ්‍යතා වෙනුවෙන් වඩාත් ඵලදායී ලෙස හඬ නැගීම සඳහා ඔවුනට හැකියාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාවේ අනෙකුත් ග්‍රාමීය ප්‍රජාවන්ට මෙන් වතුකර ප්‍රජාවට ද සමාන අයිතිවාසිකම් සහ අවස්ථා ඇති බව සහතික කිරීම සඳහා මෙම පියවර ඉතා වැදගත්ය.

මීට අමතරව මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් වතුකර ප්‍රජාව වතු සමාගම් මත යැපීම බිඳ දැමීමට උපකාරී වනු ඇත. මෙම ජනාවාසවල පාලනය රජය වෙත පවරා ගැනීම තුළින් ප්‍රජාවට ඉහළ ස්වාධීනත්වයක් සහ තම සංවර්ධනය පිළිබඳ තමාගේම තීරණ ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. ප්‍රජාව සවිබල ගැන්වීම සහ තම ජීවිතවලට බලපාන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධයෙන් ඔවුන් දරන අදහස් ඉදිරිපත් කිරීම සහතික කිරීම, සඳහා මෙම පියවර ඉතා තීරණාත්මකය.

## 5 පරිච්ඡේදය

### *සේවා නියුක්තිය*

වතුකර ප්‍රජාව තුළ සේවා නියුක්තිය ඓතිහාසික වශයෙන් මධ්‍යගත වී තිබෙන්නේ දෛනික වැටුප් ආකෘතිය (daily wage model) වටා බවත්, මෙය තිරසාරභාවයෙන් තොර හා කම්කරුවන් හට දිගුකාලීනව අයහපත් ප්‍රතිඵල ගෙන දෙන ආකෘතියක් බවත් රජය විසින් හඳුනාගෙන තිබේ.

ඒ අනුව කම්කරු හිමිකම් ආරක්ෂා කිරීම සහ ඉහළ රැකියා අවස්ථා සඳහා යොමු වීමට ඉඩ සැලසීම තහවුරු කරනු ලබන වඩාත් තිරසාර හා සාධාරණ සේවා නියුක්තික ආකෘතීන් වෙත මාරු වීම සඳහා වන අවශ්‍යතාවය රජය විසින් හඳුනාගෙන තිබේ.

### 5.1 සේවා නියුක්තිය සඳහා වූ තිරසාර ආකෘති

දෛනික වැටුප් ආකෘතිය, එහි පවතින නෛසර්ගික අස්ථාවරත්වය සහ කම්කරුවන්ට ජීවන වැටුපක් ලබා දීමට අපොහොසත් වීම මත දිගු කාලයක් මුළුල්ලේ විවේචනයට ලක්ව ඇත. ස්ථාවර ආදායමක් හෝ රැකියා සුරක්ෂිතභාවයක් පිළිබඳ සහතිකයක් ලබා නොදෙන මෙම ආකෘතිය යටතේ සෑම දිනකම කම්කරුවන් සම්පූර්ණ කළ වැඩ ප්‍රමාණය මත පදනම්ව වැටුප් ගෙවීම සිදුවේ. මෙය බොහෝ වතු කම්කරුවන්ට දරිද්‍රතාවයෙන් යුතුව ජීවත්වීමට මගපාදා ඇති අතර ඔවුන්ගේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඉන් බලාපොරොත්තුවක් නොදෙන තරම්ය.

දෛනික වැටුප් ආකෘතියෙන් ඉවත්ව වඩාත් යුක්ති සහගත බාහිර වගා ආකෘතිය (out-grower model) සහ කුඩා වතු ආකෘතිය (small holder model) වැනි ආකෘති කෙරෙහි යොමු වීම සඳහා රජය කැපවී සිටියි. මෙවැනි ආකෘතීන් තුළින් තමා වගා කරන භූමි ප්‍රමාණයේ හිමිකාරීත්වය කම්කරුවන්ට සැපයීම සිදුවන අතර එමගින් වතු කම්කරුවන් සවිබල ගැන්වීම සිදුවනු ඇත. එමගින් ඔවුන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය සහ සමාජ තත්ත්ව වැඩිදියුණු වනු ඇත.

මෙම ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා වඩාත් තිරසාර සේවා නියුක්තික ආකෘතීන්වලට යොමු වීම අත්‍යාවශ්‍යය. උදාහරණයක් වශයෙන් බාහිර වගා ආකෘතිය තුළින් කම්කරුවන්ට තමාට හිමි භූමි ප්‍රමාණය තුළ තමාගේම වගාවක් ආරම්භ කර අස්වැන්න නෙලා ගැනීමට ඉඩ සලසන අතර, ඒ සඳහා වතු සමාගම් මගින් තාක්ෂණික සහාය, යෙදවුම් සහ වෙළඳපොළ ප්‍රවේශය ලබා දිය හැකිය. මෙම ආකෘතිය තුළින් කම්කරුවන් හට තම ජීවනෝපාය කෙරෙහි තිබෙන පාලනය ඉහළ නංවන අතර, තම ඵලදායකත්වය මත ඉහළ වැටුපක් ඉපැයීමට විභවයක් නිර්මාණය කර දෙයි. එමෙන්ම, මෙමගින් කම්කරුවන්ගේ ව්‍යවසායක කුසලතා ගොඩනැංවීම දිරිගන්වන අතර, කම්කරු ප්‍රජාව අතර අයිතිය පිළිබඳ හැඟීමක් ගොඩනැඟීම ද සිදුවේ.

මීට සමානව කුඩා වතු ආකෘතිය තුළින් කම්කරුවන් හට වඩාත් විශාල භූමි ප්‍රමාණයකට හිමිකම් කීමට සහ ස්වාධීන ගොවීන් ලෙස වැඩ කිරීමට මග පාදයි. ඒ තුළින් තම ඵලදාව අදාළ වතු සමාගමට ලබා දීමට හෝ විවෘත වෙළඳපොළ තුළ විකිණීමට ඉඩ සලසා දෙයි. මෙමගින් තම ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමට සහ තමාගේම ව්‍යාපාර සඳහා අයෝජනය කිරීමට කම්කරුවන්ට හැකිවන නිසා මෙම ආකෘතිය මගින් ආර්ථික සවිබල ගැන්වීම සඳහා වඩාත් ඉහළ අවස්ථා උදාකර දෙයි.

මෙම ආකෘතීන් සඳහා යොමුවන කම්කරුවන්ට සහාය ලබා දීමට රජය කටයුතු කරනු ඇති අතර ඒ අතර ණය පහසුකම්, පුහුණුව සහ තාක්ෂණික සහාය වැනි පහසුකම් ද ඇතුළත්ය.

පහත වැටෙන ඵලදායකත්වය සහ වඩාත් තිරසාර කෘෂි කටයුතුවල අවශ්‍යතාවය වැනි වතුකර ප්‍රජාව විසින් මුහුණ දෙනු ලබන ඇතැම් බරපතල ගැටලු ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ද මෙම ආකෘතීන්වලට පවතියි. තම ඉඩමේ ඉහළ හිමිකාරීත්වයක් ලබා ගැනීම සහ ජීවනෝපාය වැඩිදියුණු කර ගැනීම සඳහා කම්කරුවන් දිරිගැන්වීම සිදුකරන මෙවන් ආකෘතීන් ක්ෂේත්‍රයේ දිගු කාලීන පැවැත්ම මෙන්ම ප්‍රජාවේ යහපැවැත්ම සඳහා ද දායක වේ.

**5.2 කම්කරු අයිතිවාසිකම් සහ සමාජ ආරක්ෂණය**

සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාර අරමුදලේ (ETF) ප්‍රතිලාභ සියලු කම්කරුවන්ට ලැබෙන පරිදි වතු සමාගම් කම්කරු නීතිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා දැඩි කොන්දේසි ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරනු ඇත. බොහෝ විට මෙවන් ප්‍රතිලාභ නොලැබෙන, බාහිර වගා ආකෘතිය යටතේ සේවය කරන කම්කරුවන් මීට ඇතුළත්වනු ඇත.

කම්කරු අයිතීන් බලාත්මක කිරීම, වතුකර ක්ෂේත්‍රයේ සේවා නියුක්තියේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා රජය දක්වන කැපවීමේ තීරණාත්මක අංගයකි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල වැනි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සඳහා ඇති ප්‍රවේශය ඇතුලු, කම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් සහ ආරක්ෂණයන් ඔවුනට අහිමි වී ඇති බව රජය විසින් හඳුනාගෙන තිබේ. මෙමගින් බොහෝ කම්කරුවන්ට අවශ්‍ය අවස්ථාවන්වල දී හිමිවිය යුතු සුරක්ෂණය අහිමි වී ගොස් ඇති අතර එය ප්‍රජාව අතර පවතින දරිද්‍රතා චක්‍රයට ද හේතු වී තිබේ.

තම සේවා නියුක්තික ආකෘතිය කුමක් වුවද, වතු ක්ෂේත්‍රයේ සියලු කම්කරුවන්හට මෙකී ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය තිබෙන බව සහතික කිරීම වෙනුවෙන් රජය කැපවී සිටියි. ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් ලෙස තම තත්ත්වය පැවතීම හේතුවෙන්, බාහිර වගා සහ කුඩා වතු ආකෘති යටතේ සේවය කරන, මෙවන් සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් හැලී ගිය කම්කරුවන් මීට ඇතුළත් වේ. ස්වයං රැකියාවල නියුතු හා සාම්ප්‍රදායික නොවන සේවා නියුක්තික එකඟතා මත සේවය කරන කම්කරුවන් ඇතුලු, සියලු කම්කරුවන් ආවරණය වන පරිදි සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා වූ යාන්ත්‍රණ ගොඩනැගීම සඳහා වතු සමාගම් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග රජය එක්ව කටයුතු කරනු ඇත.

සමාජ ආරක්ෂණ ප්‍රතිලාභවලට අමතරව සේවයේ නියුතු පැය ගණන, රැකියා ස්ථානයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහ ඒකාබද්ධ තැරැව් කිරීම සඳහා ඇති අයිතිය ඇතුලු කාර්ය තත්ත්වයන්වලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමට රජය කටයුතු කරනු ඇත. කම්කරුවන්ට සාධාරණව හා ගරුත්වයෙන් යුතුව සලකන බව සහතික කිරීමට හා ඔවුන්ගේ හිමිකම් වෙනුවෙන් පෙනී සිටීමට අවශ්‍ය මෙවලම් සහ සම්පත් ඔවුන් සතුව ඇති බව සහතික කිරීමට මෙය උපකාරී වනු ඇත. කම්කරු නීති ප්‍රකාරව කටයුතු කිරීම, අධීක්ෂණය කිරීම සහ සේවක අයිතීන් උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව පියවර ගැනීම සඳහා කම්කරු පරීක්ෂණ සේවාවල ධාරිතාව ශක්තිමත් කිරීමට ද රජය කටයුතු කරනු ඇත.

වතුකර ක්ෂේත්‍රයේ සේවා නියුක්තියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ කම්කරුවන්ට හිමිවන ආරක්ෂාව සහ ප්‍රතිලාභ සඳහා වූ ප්‍රවේශය සහතික කිරීම සඳහා මෙම පියවර අත්‍යවශ්‍ය වේ. ක්ෂේත්‍රයේ යහපත් ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය දක්වන කැපවීම ද මින් පිළිබිඹු වේ.

**5.3 වතු සමාගම් සමග සාකච්ඡා පැවැත්වීම**

කම්කරුවන් සහ වතු සමාගම් අතර සබඳතාව බොහෝ විට නිරූපණය කරනු ලබන්නේ බල අසමතුලිතතාවයන් සහ අර්ථවත් සංවාදයක් නොමැතිකම මතය. කම්කරුවන්ට ඔවුන්ගේ සේවා නියුක්තියේ නියමයන් සහ කොන්දේසි සම්බන්ධයෙන් අදහස් දැක්වීමට එතරම් ඉඩ අවකාශ නොමැති අතර අඩු වැටුප්, දුර්වල කාර්ය තත්ත්වයන් සහ නිෂ්පාදනවල අසාධාරණ මිල වැනි සූරාකෑම්වලට මෙය හේතු වී තිබේ.

කම්කරුවන් සහ වතු සමාගම් අතර වඩාත් සමතුලිත සහ යුක්තිගරුක සබඳතාවයක් ගොඩනැගීම සඳහා පවතින අවශ්‍යතාවය රජය විසින් හඳුනා ගෙන තිබේ. මෙම අන්තය ආමන්ත්‍රණය කිරීම සඳහා දෙපාර්ශ්වය අතර පැවැත්විය යුතු සාකච්ඡාවල මැදිහත්කරුවකු ලෙස කටයුතු කරමින් කම්කරුවන්ගේ හඬට සවන් දීම සහ ඔවුන්ගේ වුවමනා එපාකම් සැලකිල්ලට ගැනීම සහතික කිරීම රජයේ අරමුණ වී තිබේ. ආර්ථික ගැටලු වලට අමතරව සෞඛ්‍යය, ආරක්ෂාව, පුහුණුව සහ සංවර්ධන අවස්ථාවන් වැනි කාර්ය තත්ත්වයන්වලට අදාළ ගැටලු සහ සංවිධානය වීමට සහ ඒකාබද්ධ එකඟතාවලට පැමිණීමට ඔවුනට ඇති අයිතිය සම්බන්ධ ගැටලු ආදිය ආමන්ත්‍රණය කිරීමට ද රජය කටයුතු කරනු ඇත. කම්කරුවන් සහ වතු සමාගම් අතර වඩාත් සහයෝගී හා යුක්ති සහගත සබඳතාවයක් ගොඩනැගීම තුළින් වඩාත් තිරසාර වතුකර ක්ෂේත්‍රයක් බිහි කිරීමට රජය අපේක්ෂා කරයි.

## 6 වන පරිච්ඡේදය

*ආර්ථික අභිවෘද්ධිය*

ආර්ථික අභිවෘද්ධිය යනු, වතුකර ප්‍රජාව සඳහා වූ රජයේ දැක්මේ තීරණාත්මක අංගයකි. හුදෙක් වතු කම්කරු වෘත්තීය මත යැපෙනවාට වඩා අනෙකුත් අංශවල රැකියා අවස්ථා සඳහා වූ කඳුකර කලාපයේ විවිධාංගකෘත ආර්ථිකයක් නිර්මාණය කිරීම මෙහි අරමුණයි.

### 6.1 නව රැකියා අවස්ථා බිහි කිරීම

කඳුකර කලාපයේ, ආර්ථිකය, ඓතිහාසික වශයෙන් වතු කම්කරු වෘත්තීය මතම යැපෙන්නක් බවට රජය විසින් හඳුනාගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස කම්කරුවන්හට වෙනත් ආකාරයේ රැකියාවක නිරතවීමට ඇති අවස්ථා සීමා වී ගොස් පවතින අතර තම ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා ඔවුන් සතු හැකියාව ද හීන වී තිබේ.

විශේෂයෙන ඉහළ වැටුප් ලබාදෙන, වැඩිදියුණු කළ කාර්ය තත්ත්වයන් සහිත හා කුසලතා සංවර්ධනය වඩාත් ඉහළ අවස්ථාවන් ලබාදෙන අංශවල රැකියා අවස්ථා කඳුකර කලාපයේ ස්ථාපිත කිරීම සඳහා පවතින අවශ්‍යතාවය රජය විසින් හඳුනාගෙන තිබේ. මෙම අන්තය සැලකිල්ලට ගෙන කඳුකර කලාපය වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ එම කලාපය තුළ නව කර්මාන්ත බිහිකිරීම සඳහා රජය ජාත්‍යන්තර හවුල්කරුවන් සමග කටයුතු කරනු ඇත. මෙම කර්මාන්ත අතර නිෂ්පාන කෘෂි පිරිසැකසුම, සංචාරක කර්මාන්තය සහ තොරතුරු තාක්ෂණය සහ තවත් අංශ ඇතුළත් විය හැකිය. මෙකී කර්මාන්තවල වර්ධනය උදෙසා මාර්ග, විදුලිය සහ විදුලි සංදේශ ආදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට ද රජය කටයුතු කරනු ඇත.

කඳුකර කලාපයේ විවිධාංගකෘත කර්මානත බිහිකිරීම තුළින් නව රැකියා අවස්ථා බිහිවීම පමණක් නොව එම කලාපයේ පුළුල් ආර්ථික සංවර්ධනය සඳහා උපකාර ලැබීම ද සිදුවනු ඇත. ජීවන තත්ත්ව ඉහළ නැංවීම, දරිද්‍රතාවය අවම කිරීම සහ වඩාත් උද්දීප්ත වූ ද විවිධත්වයකින් යුක්ත වූ ද දේශීය ආර්ථිකයක් බිහි කිරීම සඳහා මෙය දායකවනු ඇත. නව කුසලතා බිහිකර ගැනීම සහ මීට පෙර හමු නොවූ රැකියා අවස්ථා සඳහා කම්කරුවන්ට මංපෙත් විවර වීම ද මින් සිදුවනු ඇත.

### 6.2 ව්‍යවසායකත්වය

පුහුණු වැඩමුළු, ණය පහසුකම් සඳහා ප්‍රවේශය සහ ව්‍යාපාර සංවර්ධන සේවාවන් ආදිය සැපයීම තුළින් වතුකර ප්‍රජාව තුළ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමට රජය කටයුතු කරනු ඇත. තමාගේම ව්‍යාපාර ආරම්භ කිරීම සහ තම ප්‍රජාව වෙනුවෙන් රැකියා අවස්ථා බිහි කිරීම සඳහා ප්‍රජා සාමාජිකයන් සවිබල ගැන්වීම මින් සිදුවනු ඇත. ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, කඳුකර කලාපයේ ආර්ථික අභිවෘද්ධිය ඇති කිරීමෙහි ලා වැදගත්වන ප්‍රධාන උපාය මාර්ගයකි. තමාගේම ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රජා සාමාජිකයන් ධෛර්යමත් කිරීම තුළින් නව ආදායම් මාර්ග සහ සේවා නියුක්තීන් බිහි කිරීම, වතු කම්කරු සේවය මත යැපීම අවම කිරීම සහ නවෝත්පාදන සහ ස්වයං විශ්වාසයෙන් යුතු සංස්කෘතියක් බිහි කිරීම රජයේ ඉලක්කය වී තිබේ.

ව්‍යවසායකයන් උදෙසා ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය සාක්ෂරතාව සහ අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩමුළු දියත් කිරීම ඇතුලු සහාය සේවාවන් රැසක් ලබා දීමට රජය කැපවී සිටියි. විශේෂයෙන්ම කාන්තාවන් සහ වෙනත් ආන්තිකකරණයට ලක්වන කණ්ඩායම්වලට අයත් සුළු ව්‍යාපාර ඇතුලු කුඩා ව්‍යාපාරවලට ණය පහසුකම් ලබා ගැනීම සඳහා ඇති ප්‍රවේශය ඉහළ දැමීම සඳහා ද රජය මූල්‍ය ආයතන සමග එක්ව කටයුතු කරනු ඇත. මීට අමතරව, ව්‍යවසායකයන් හට ඔවුන්ගේ ව්‍යාපාර සාර්ථකකර ගැනීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික සහාය, උපදේශනය සහ ජාලකරණ අවස්ථා ලබාදීම සඳහා කඳුකර කලාපය තුළ ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන, සමාජයන් සහ ව්‍යවසාය ජනන මධ්‍යස්ථාන (enterpreneurship incubation centres) බිහි කිරීමට රජය කටයුතු කරනු ඇත.

ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම තුළින් භාණ්ඩ හා සේවා සඳහා වන වෙළඳපොළක් නිර්මාණය වීම සහ දේශීය සැපයුම්දාම දිරිගැන්වීම සිදුවන නිසා දේශීය ආර්ථික සංවර්ධනය නගා සිටුවීමට ද මෙය දායකවනු ඇත. මෙය දේශීය ආර්ථිකය විවිධාංගීකරණය කොට ආර්ථික කැළඹීම් හමුවේ ප්‍රජාව සතු ප්‍රත්‍යාස්ථිතිය ද ඉහළ නංවනු ඇත.

### 6.3 රජයේ හා පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයන්

අරමුදල් යොදවා කඳුකර කලාපයේ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා රජයේ සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වය (public-private partnerships: PPPs) දිරිගැන්වීමට රජය කටයුතු කරනු ඇත. යටිතල පහුසකම් සංවර්ධනය, වෙළඳපොළ සඳහා වූ ප්‍රවේශය වැඩිදියුණු කිරීම, සහ පොදුවේ කලාපයේ ආර්ථික පරිසරය වැඩිදියුණු කිරීම මෙම හවුල්කාරීත්වයන්වල ඉලක්කය වී තිබේ. රජයේ සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වය, කඳුකර කලාපයේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කෙරේ පවතින වැදගත් මෙවලමකි. රජය සහ පෞද්ගලික අංශය යන දෙපාර්ශ්වයේ ම සම්පත් සහ ප්‍රවීණතාව භාවිතයට ගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමට, සේවා ලබා දීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ කලාපය වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජයේ සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයට හැකි වේ.

අරමුදල් යොදවා කඳුකර කලාපයේ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පෞද්ගලික අංශයේ හවුල්කාරීත්වය ලබා ගැනීමට රජය සක්‍රියව කටයුතු කරනු ඇත. මාර්ග හා පාලම් ඉදිකිරීම සහ අනෙකුත් ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම ජල හා සෞඛ්‍යාරක්ෂිත පද්ධති ගොඩනැගීම සහ විදුලිය හා විදුලි සංදේශ ජාලයන් පුළුල් කිරීම ආදිය මීට ඇතුළත් විය හැකිය. මෙවන් ව්‍යාපෘති මගින් වතුකර ප්‍රජාවේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරන අතරම වෙළඳපොළ හා සේවා සඳහා පවතින ප්‍රවේශය වැඩිදියුණු වීම මත නව ආර්ථික අවස්ථා බිහිකරනු ඇත.

යටිතල පහසුකම් සංවර්ධනයට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා හා කෘෂිකර්මාන්තය ආදී ක්ෂේත්‍රවල රජයේ සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වය ලබා ගැනීම සඳහා ඇති අවස්ථා සොයා බැලීමට ද රජය කටයුතු කරනු ඇත. උදාහරණයක් ලෙස කඳුකර කලාපයේ අධ්‍යාපනයේ සහ සෞඛ්‍ය සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හෝ නව කෘෂි තාක්ෂණයන් සහ භාවිතයන් යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ සමාගම් සමග හවුල්කාරීත්වයන් ගොඩනගා ගැනීම උපකාරී වේ. මෙම හවුල්කාරීත්වයන් වතුකර ප්‍රජාව සඳහා නියත ප්‍රතිලාභ ලබාදෙන බවට සහතික කරන හා ඒවා රජයේ පුළුල් සංවර්ධන අභිමතාර්ථයන් හා ගැලපෙන අන්දමින් ප්‍රවේශමෙන් ගොඩනැගෙනු ඇත.

රජයේ සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම, කඳුකර කලාපයේ පළාත් පාලන බලධාරීන් සහ වෙනත් රජයේ ආයතනවල ධාරිතා ගොඩනැංවීමට ද ඉවහල් වනු ඇත. පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීමෙන් මෙකී ආයතනවලට වටිනා අත්දැකීම් සමුදායක් ලබාගත හැකි වනවා සේම, ව්‍යාපෘති කළමනාකරණය, සේවා සැපයීම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ලබාගැනීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත හැකි අතර, එමගින් ඔවුන්ගේ කාර්යසාධනය සහ තිරසාරභාවය දිගු කාලීන වශයෙන් වැඩිදියුණුකර ගත හැකිය.

## 7 වන පරිච්ඡේදය

### *සෞඛ්‍ය*

වතුකර ප්‍රජාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම නොසලකා හැර ඇති බවත්, බොහෝ කම්කරුවන් සෞඛ්‍ය සේවාවන් වෙත නිසි පරිදි ප්‍රවේශවීමට නොහැකිව පීඩා විඳින බවත් රජය විසින් හඳුනාගෙන තිබේ.

වතුකර ප්‍රජාවට සුවිශේෂී වූ අවශ්‍යතා ආමන්ත්‍රණය කරනු ලබන පරිපූර්ණ සෞඛ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කොට මෙම තත්ත්වය නිවැරදි කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

### 7.1 සමූහ රෝහල් (Cluster Hospitals)

වතුකරයේ සෞඛ්‍ය මධ්‍යස්ථාන සමූහ රෝහල් බවට පත්කරමින් සමූහ රෝහල් (Cluster Hospitals) සංකල්පය ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරනු ඇත. මෙවන් රෝහල් හරහා හදිසි සේවා, මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සහ නිදන්ගත තත්ත්ව සඳහා ප්‍රතිකාර කිරීම ඇතුළු පුළුල් පරාසයකට දිවයන සෞඛ්‍ය සේවාවන් රැසක් ලබාදෙනු ඇත. මෙම රෝහල් තුළ ක්‍රියාත්මක වීමට අවශ්‍ය ගිලන්රථ සපයා ගැනීම සඳහා අරමුදල් එක්රැස් කිරීමට ද රජය කටයුතු කරනු ඇත.

වතුකරයේ පවතින වෛද්‍ය මධ්‍යස්ථාන රැසක් ඒකාබද්ධ කොට වඩාත් විශාල වැඩිදියුණු කළ පහසුකම්වලින් සමන්විත හා පූර්ණ වශයෙන් සෞඛ්‍ය සේවාවන් ලබා දිය හැකි රෝහල් බවට පත් කිරීම සමූහ රෝහල් සංකල්පයේ හරයයි. මෙවන් රෝහල්වලට පුහුණුව ලත් සෞඛ්‍ය සේවා වෘත්තිකයන් බඳවාගනු ලබන අතර, නවීන වෛද්‍ය උපකරණ සහ පහසුකම් ලබා දෙනු ලැබේ. හදිසි අවස්ථාවන්වල දී රෝගීන් රෝහල් වෙත රැගෙන ඒම සඳහා පහසුකම් සහිත ගිලන්රථ ජාලයක් ද මීට අනුබද්ධව ක්‍රියාත්මක වේ.

රෝග නිවාරණය, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීම, මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සහ දියවැඩියාව සහ අධි රුධිර පීඩනය වැනි නිදන්ගත තත්ත්වයන් කළමනාකරණය කිරීම ඇතුලු ප්‍රාථමික හා ද්විතියික සෞඛ්‍ය සේවා සැපයීම කෙරෙහි සමූහ රෝහල් අවධානය යොමු කරනු ඇත. මානසික සෞඛ්‍ය සේවා, ප්‍රජනක සෞඛ්‍ය සේවා සහ වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන් සඳහා වන විශේෂ සේවාවන් සැපයීමට ද මෙවන් රෝහල් කටයුතු කරනු ඇත.

සමූහ රෝහල්වල පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ විදුලිය වැනි යටිතල පහසුකම් හා සේවාවන් වැඩිදියුණු කිරීමට ද රජය කටයුතු කරනු ඇත. රෝගීන්ට මෙන්ම සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයට ද ආරක්ෂිත හා සනීපාරක්ෂිත වටපිටාවක් බිහි කිරීමට මෙය උපකාරී වනු ඇත.

තම නිවසට සමීප ස්ථානවලින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතු සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා ප්‍රවේශ විවර වීම මත සමූහ රෝහල් සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් වතුකර ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වයන් නගා සිටුවිය හැකිය. සේවාවන් ලැබීම සීමිත වීම හමුවේ ඓතිහාසික වශයෙන් පීඩාවට පත් වූ ප්‍රජාවක් වෙත සේවාවන් ලබාදීම තුළින් රජයේ සෞඛ්‍ය සේවා පද්ධතීන් මත පැටවෙන බර අවම කිරීමට ද මෙය දායක වනු ඇත.

### 7.2 මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම

අධික ලෙස ආතතියට සහ මානසික සෞඛ්‍ය ගැටලුවලට මුහුණදෙනු ලබන කම්කරුවන් සිටිය ද, බොහෝ කලක පටන් සෞඛ්‍ය සේවාවන්වල මානසික සෞඛ්‍යය නොසලකා හැර තිබේ. වතුකර සේවයේ පවතින අධික ශ්‍රම ඉල්ලුම, හුදෙකලා හා බෙලහීන තත්ත්ව සමග ජීවත්වීමට සිදුවීම මත පැන නගින අභියෝග සමග යුග්මවීම හමුවේ, වතුකර ප්‍රජාව අතර විෂාදිය, කාංසාව සහ වෙනත් මානසික සෞඛ්‍ය ගැටලුවල ඉහළ යාමක් දක්නට හැකිය.

මානසික සෞඛ්‍ය සේවාවන් සමූහ රෝහල් වෙත අනුබද්ධ කිරීම හා වෙනත් ප්‍රජා සේවාවන් වෙත අනුබද්ධ කිරීම තුළින් මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීමට රජය කැපවී සිටියි. උපදේශනය සහ මනෝවිද්‍යාත්මක සහාය සේවාවන් සැපයීම මෙන්ම මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම උදෙසා ආතති කළමනාකරණ වැඩසටහන් සහ මුලපිරීම් ක්‍රියාත්මක කිරීම ආදිය මීට ඇතුළත් වේ.

මානසික සෞඛ්‍ය ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මානසික සෞඛ්‍ය ගැටලු සඳහා සහාය පැතීම වටා ගෙතී පවතින අපකීර්තිය අවම කිරීම සඳහා ද රජය කටයුතු කරනු ඇත.

7.3 රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණය

එන්නත් වැඩසටහන්, සෞඛ්‍ය අධ්‍යාපනය සහ පෝෂණ වැඩසටහන් ආදී රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීමට රජය කටයුතු කරනු ඇත. දරුවන් හා ගර්භනී කාන්තාවන් අතර පවතින මන්දපෝෂණය ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇති අතර එමගින් ඔවුනට සෞඛ්‍යමත් වර්ධනයක් උදෙසා වූ නිසි පෝෂ්‍යපදාර්ථ ලබාදීම සහතික කෙරෙනු ඇත.

රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන්, වතුකර ක්ෂේත්‍රයේ සෞඛ්‍ය තත්ත්වයන් නඟා සිටුවීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන උපාය මාර්ගවල තීරණාත්මක අංගයකි. රෝග නිවාරණය තුළින් රෝග නිසා ජනතාව වෙත පැටවෙන බර අවම කිරීමට හා පොදුවේ ප්‍රජාවගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම රජයේ තවත් ඉලක්කයකි.

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන දරුවන් හා ගර්භනී කාන්තාවන් අතර පවතින අධික මන්දපෝෂණ තත්ත්වයන් සැලකිල්ලට ගෙන පෝෂණය ද රජයේ රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන් පිළිබඳ උපාය මාර්ගයේ ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වූ අංගයකි. අඩු වර්ධනය, උපතේ දී අඩු බරක් පැවතීම සහ රෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් පැවතීම ආදී දුර්වල සෞඛ්‍ය තත්ත්වයන් සඳහා මන්දපෝෂණය ප්‍රධාන හේතු සාධකයක් වී පවතියි. පෝෂ්‍යදායි ආහාර සඳහා පවතින ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා අතිරේක ආහාර බෙදාහැරීම සහ බලීකෘත ආහාර බෙදාහැරීම මෙන්ම මව්කිරි ලබාදීම සහ සෞඛ්‍ය සම්පන්න ආහාර පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ආදිය රජය විසින් ක්‍රියාත්මක කරනු ඇත.

දරිද්‍රතාවය, ආහාර අනාරක්ෂිතභාවය සහ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සඳහා ඇති ප්‍රවේශයේ දුර්වලකම වැනි මන්දපෝෂණයට පාදකවන අභ්‍යන්තර හේතූන් ආමන්ත්‍රණය කිරීමට රජය කටයුතු කරනු ඇත. ආහාර නිෂ්පාදනය සහ බෙදාහැරීම වැඩිදියුණු කිරීම සඳහා වන මුලපිරීම් මෙන්ම ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සහ නාස්තිය අවම කිරීමේ වැඩසටහන් ද මීට ඇතුළත් වනු ඇත. සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂිත, පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා රජය මෙරට ප්‍රජාවන් සමග ද කටයුතු කිරීමට සිදුවනු ඇත.

වතුකර ප්‍රජාව අතර රෝගී තත්ත්ව ඇතිවීම අවම කිරීමට හා පොදුවේ සෞඛ්‍යය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීමට මෙම රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන් හා පෝෂණ වැඩසටහන් ඉවහල්වනු ඇත. ප්‍රතිකාර සේවා සඳහා පවතින ඉල්ලුම අවමකොට සෞඛ්‍ය තත්ත්වයන් නගාසිටුවීම සෞඛ්‍ය සේවා පද්ධතියේ දිගු කාලීන තිරසාරභාවය සඳහා ද මෙය දායකවනු ඇත.

## 8 වන පරිච්ඡේදය

### *අධ්‍යාපනය*

අධ්‍යාපනය දිගු කාලීන සමාජ, ආර්ථික සංවර්ධනයට පදනම සපයන බැවින් අධ්‍යාපනය යනු වතුකර ප්‍රජාව පිළිබඳ රජයේ දැක්මේ ප්‍රධානතම අංගයකි.

පරිපූර්ණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතිකිරීම තුළින් වතුකර ප්‍රජාවේ අධ්‍යාපන තත්ත්ව වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

**8.1 මුල් ළමාවිය අධ්‍යාපනය**

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන දරුවන් හට ජීවිතයේ හොඳම ආරම්භයක් ලබා දීම සහතික කිරීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපනය තීරණාත්මක සාධකයකි. මුල් ළමාවිය, මොළයේ වර්ධනයේ තීරණාත්මක අවධියක් වන බැවින්, හා දරුවන්ගේ ඥානාත්මක, සමාජීය සහ චිත්තවේගීය සංවර්ධනය උදෙසා උසස් තත්ත්වයෙන් යුතු මුල් ළමාවිය අධ්‍යාපනයක් ලබා දිය යුතු බව පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ.

ළමා නිවාස, මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත්කොට දරුවන්ගේ අනාගත අධ්‍යාපනය සඳහා ශක්තිමත් පදනමක් සකස් කිරීමට රජය කටයුතු කරනු ඇත. මෙම මධ්‍යස්ථානවලින් උද්යෝගීමත් ඉගෙනුම් වටපිටාවක්, සුදුසුකම්ලත් ගුරුවරුන් සහ පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාදෙනු ඇති අතර එමගින් දරුවන්ගේ ශාරීරික හා ඥානාත්මක සංවර්ධනය වැඩිදියුණු කරනු ඇත. භාෂාව, සාක්ෂරතාව, ගණිත ඥානය, හා ගැටළු විසඳීමේ හැකියාව මෙන්ම සමාජ හා චිත්තවේග කුසලතා ඇතුලු ප්‍රධාන කුසලතා වැඩිදියුණු කරන විෂය නිර්දේශයක් ද මෙම මධ්‍යස්ථානවල සම්පාදනය වනු ඇත.

ඉදිරියේ දී මතුවිය හැකි ගැටලු කලින් හඳුනාගෙන ඒ සඳහා නිසි මැදිහත්වීමක් ලබා දෙන සෞඛ්‍ය හා සංවර්ධන පරීක්ෂා ද මෙම මධ්‍යස්ථාන වෙතින් ලැබෙනු ඇත. දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහනේ දී තම දරුවන්ට නිවස තුළ දී ඔවුන්ගේ ඉගෙනුම හා සංවර්ධනය සඳහා අවශ්‍ය වන සහාය ලබාදීම සඳහා ඉවහල්වන දැනුම සහ කුසලතා දරුවන්ගේ දෙමාපියන් හා රැකබලාගන්නන් වෙත ලබා දීමට රජය කටයුතු කරනු ඇත.

ළමා නිවාස, මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත්කිරීම වතුකර ක්ෂේත්‍රයේ අධ්‍යාපන තත්ත්ව නඟා සිටුවීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන උපාය මාර්ගයේ ප්‍රධාන අංගයකි. දරුවන්ගේ මුල් වසර කිහිපය තුළ ශක්තිමත් පදනමක් සකස් කිරීම මගින් ඔවුන් ප්‍රාථමික පාසල් සහ ඉන් ඔබ්බට ලබන සාර්ථකත්වයට හොඳින් සූදානම් කරවීම සහතික කිරීම රජයේ ඉලක්කය වී තිබේ.

**8.2 ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය**

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය දරුවකුගේ වර්ධනයේ තීරණාත්මක අවධීන් වන අතර දරුවන්ට ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගැනීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. නමුත්, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම, සීමිත සම්පත් සහ පුහුණු ගුරුවරුන්ගේ හිඟය නිසා වතුකර ක්ෂේත්‍රයේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පවතින්නේ ඓතිහාසික වශයෙන් දුර්වල මට්ටමකය.

වතුකර පෙදෙස්වල ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමෙන් මෙම ගැටලු ආමන්ත්‍රණය කිරීමට රජය කැපවී සිටියි. පන්ති කාමර, පුස්තකාල, විද්‍යාගාර සහ නේවාසික පහසුකම් ඇතුලු පාසල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් සිසුන් හා ගුරුවරුන් හට ආරක්ෂිත හා සහෝපකාරී ඉගැන්වීම් හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සහතික කිරීම මීට ඇතුළත් ය. ඒ අනුව, ත්‍රෛභාෂික (සිංහල, දමිළ, ඉංග්‍රීසි) අධ්‍යාපනයක් ලබා දීම හා නවීන තාක්ෂණයෙන් යුතු සුහුරු පන්ති කාමර (smart classrooms) සැපයීම සිදුවනු ඇත.

යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අමතරව වතුකර පාසල්වල ඉගැන්වීමේ හා ඉගෙනීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහිද රජය අවධානය යොමුකරනු ඇත. දරුවන් විසින් භාෂා තුනම ප්‍රගුණ කළ බව සහ එමගින් ජාතික සහ ගෝලීය රැකියා වෙළඳපොළ තුළ ඵලදායී ලෙස තරඟ වැදීම සඳහා ඔවුනට හැකියාව පවතින බව සහතික කිරීම සඳහා ත්‍රෛභාෂික අධ්‍යාපනය (සිංහල, දමිළ, ඉංග්‍රීසි) ලබා දීම මීට ඇතුළත් වනු ඇත. අන්තර් ක්‍රියාකාරී සුදුපුවරු (white boards) සහ ඩිජිටල් ඉගෙනුම් වේදිකා ඇතුලු නවීන තාක්ෂණයෙන් යුතු සුහුරු පන්ති කාමර හඳුන්වා දීම තුළින් පුද්ගල ප්‍රමාණවත් සහ ඉගෙනුමට අනුගතවිය හැකි වටපිටාවක් ලබා දීමට ද රජය කටයුතු කරනු ඇත.

වතුකර පාසල්වල ගුරුවරුන්, උසස් තත්ත්වයේ උපදෙස් ලබාදීමට අවශ්‍ය දැනුමෙන් හා කුසලතාවලින් සන්නද්ධබව සහතික කිරීම තුළින් ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට රජය කටයුතු කරනු ඇත. පන්ති කාමර තුළ දී තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණුව මෙන්ම සිසුන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා පරිපූර්ණභාවයෙන් යුතු සහ වෙනස් වූ ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පුහුණුව ලබාදීම මීට ඇතුළත් වේ.

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවීම සඳහා මෙසේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය අරමුණු කොටගත් ආයෝජනයන් සිදුකරනු ලබන අතර එමගින් උසස් අධ්‍යාපනය හා ශ්‍රම බලකාය සඳහා ප්‍රවිශ්ට වීම සඳහා දරුවන්ට අවශ්‍ය දැනුම හා කුසලතා ඔවුනට පවතින බව සහතික කරනු ලබයි.

### 8.3 උසස් අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය

උසස් අධ්‍යාපනය යනු සමාජීය හා ආර්ථික ධාවනය සඳහා අවශ්‍ය වන ප්‍රධාන අංගයක් වන අතර වතුකර ප්‍රජාවේ සිසුන් හට ඉහළ ගුණාත්මකභාවයකින් යුතු උසස් අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දීම සහතික කිරීම සඳහා රජය කැපවී සිටියි.

නුවරඑළියේ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට රජය කටයුතු කරනු ඇත. මෙම විශ්වවිද්‍යාලය වතුකර ප්‍රජාවේ ජීවත්වන සිසුන් හට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දෙමින් නවීන ශ්‍රම බලකායට අවශ්‍ය නිපුණතාවලින් ඔවුන් සන්නද්ධ කරනු ඇත. කඳුකර කලාපයේ මෙන්ම පොදුවේ රටේ අනාගත ආර්ථික අභිවෘද්ධිය උදෙසා තීරණාත්මක වන STEM (විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිතය) සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර ආශ්‍රිත උසස් අධ්‍යාපනයක් ලැබීම සහ එමගින් කඳුකර කලාපයේ සිසුන්ට උසස් අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම සඳහා නුවරඑළියේ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම ඉවහලවනු ඇත. මෙම විශ්වවිද්‍යාලය උක්ත ක්ෂේත්‍රවල උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් මාලාවන් මෙන්ම පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා අවස්ථා ලබාදෙනු ඇත.

ශිෂ්‍යත්ව, මූල්‍යාධාර සහ වෙනත් සහාය සේවා සැපයීම ඇතුලුව වතුකර ප්‍රජාවේ සිසුන්ට සියලුම විශ්වවිද්‍යාලවලට ප්‍රවේශවිය හැකි බව සහතික කිරීමට රජය කටයුතු කරනු ඇත.

උසස් අධ්‍යාපනයට අමතරව කෘෂිකර්මාන්තය, නිෂ්පාදන, සංචාරක කර්මාන්තය සහ සේවා ඇතුලු විවිධ ක්ෂේත්‍රවල රැකියා සඳහා සිසුන් සූදානම් කරවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට ද රජය කටයුතු කරනු ඇත. දේශීය කර්මාන්ත හා සේවායෝජකයන්ගේ අවශ්‍යතා හා ගැලපෙන මෙම වැඩසටහන් විසින් සිසුන්ට ශ්‍රම බලකාය තුළ සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික කුසලතා සහ අත්දැකීම් ලබාදෙනු ඇත. මෙම වැඩසටහන් ශ්‍රම වෙළඳපොළේ අවශ්‍යතාවලට අදාළ සහ ගැලපෙන බවට සහතික කරන රජය ඒ තුළින් මෙම වැඩසටහන් සංවර්ධනය කිරීමට සහ බෙදාහැරීමට කර්මාන්ත හවුල්කරුවන් සමග කටයුතු කරනු ඇත.

උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම වතුකර ප්‍රජාවේ සිසුන්ට නව අවස්ථා නිර්මාණය කිරීමට ඉවහල්වන අතර, එය කඳුකර කලාපයේ දිගු කාලීන ආර්ථික සංවර්ධනයට ද දායක වේ. ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රජාව සහ අනෙකුත් කණ්ඩායම් අතර අධ්‍යාපන මට්ටම් සහ ආදායම්වල පවතින විෂමතා අවම කිරීමට ද එය ඉවහල්වනු ඇත.

## 9 පරිච්ඡේදය

### ළමා සුබසාධනය සහ සංවර්ධනය

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන දරුවන් පොදුවේ ඔවුන්ගේ සංවර්ධනය සහ යහපැවැත්මට බාධා පමුණුවන සුවිශේෂී අභියෝගයන් රැසකට මුහුණ දෙන බව ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන තිබේ. ඉහළ දරිද්‍රතා මට්ටම්, ගුණාත්මකභාවයෙන් යුතු අධ්‍යාපනයක් හා සෞඛ්‍ය සේවා ලබා ගැනීමට ඇති සීමිත ප්‍රවේශය සහ ළමා ආරක්ෂණ සංකූලතා බරපතල ගැටලු බවට පත්ව තිබේ. දරුවන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කරන සහ ඔවුන්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම ප්‍රවර්ධනය කරන පරිපූර්ණ ළමා සුබසාධන හා සංවර්ධන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ මෙම අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමට රජය කැපවී සිටියි.

#### 9.1 ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ඇති ප්‍රවේශය

බොහෝ දරුවන්ට කල්තියාම පාසල් හැරයාමට හේතුවන අවිධිමත් පාසල් යටිතල පහසුකම්, පුහුණු ගුරුවරුන් නොමැතිකම සහ සමාජ-ආර්ථික බාධකයන් ආදී කරුණු මත වතුකර ක්ෂේත්‍රයේ දරුවන්හට ඓතිහාසික වශයෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම සඳහා ඇති ප්‍රවේශයට බාධක පැනවී තිබේ. මෙසේ අධ්‍යාපන අවස්ථා අහිමිවීම නිසා දරිද්‍රතා චක්‍රය නිර්මාණය වන අතර වතුකර ප්‍රජාවේ දරුවන්ගේ අනාගතය අවදානමේ වැටී තිබේ.

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන සියලු දරුවන්හට ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීමටත් ඒ සඳහා ඔවුන් සවිබල ගන්වා ඔවුන්ගේ පාසල් ගමන සහතිකකර වඩාත් යහපත් අනාගතයක් ගොඩනැගීම සඳහාත් අවශ්‍ය මෙවලම් ඔවුනට ලබාදීමටත් රජය කැපවී සිටියි.

පාසල් ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම, නවීන ඉගැන්වීම් ආධාරක සැපයීම සහ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක පහසුකම් පාසල් තුළ ස්ථාපිත කිරීම සහතික කිරීම මගින් වතුකර ක්ෂේත්‍රයේ අධ්‍යාපන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට රජය කටයුතු කරනු ඇත.

#### 9.2 ළමා ආරක්ෂණය සහ සුරක්ෂිතභාවය

අපයෝජනය, සූරාකෑමට ලක්වීම, ළමා මෙහෙකාර සේවය සහ ළමා ජාවාරම ආදී සිදුවීම් හමුවේ දරුවන් අවදානමට ලක්වන පසුබිමක, වතුකර ක්ෂේත්‍රය තුළ ළමා ආරක්ෂණය තීරණාත්මක සාධකයක් බවට පත්ව තිබේ. දරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සහ ඔවුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම සඳහා ශක්තිමත් ළමා ආරක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය බව රජය විසින් හඳුනාගෙන තිබේ.

නීතිය ක්‍රියාත්මක කරන ඒකක, අධිකරණය, සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍ර ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කරමින් වතුකර ක්ෂේත්‍රයේ ළමා ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට රජය කටයුතු කරනු ඇත.

ළමා අපයෝජනය, සූරාකෑම සහ ළමා ජාවාරම වැළැක්වීම හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම ඉලක්කකොටගත් දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළත් රාජ්‍ය අනුග්‍රහය ලද පරිපූර්ණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරනු ඇත. දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ වින්දිතයන් හා අවදානමට ලක් වූ දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන උපදේශන, සෞඛ්‍ය සේවා සහ නීතිමය හා මනෝ සාමාජීය සහාය ආදී සේවාවන්ට ඇති ප්‍රවේශය සහතික කිරීම මෙම යාන්ත්‍රණයන්ට ඇතුළත් වනු ඇත.

#### 9.3 ළමා සෞඛ්‍යය සහ පෝෂණය

වතුකර ක්ෂේත්‍රයේ දරුවන් අතර මන්දපෝෂණය සහ දුර්වල සෞඛ්‍ය තත්ත්වයන් බහුල වශයෙන් පවතින අතර මෙමගින වර්ධනය දුර්වලවීම, ඥානාත්මක ප්‍රමාදයන් සහ රෝගවලට ගොදුරුවීමේ වැඩි අවදානමක් පැවතීම ආදී තත්ත්ව ඇතිව තිබේ. සෞඛ්‍ය සේවාවන් වෙත පවතින සීමිත ප්‍රවේශය සහ නිසි පෝෂණය සහ සනීපාරක්ෂක පුරුදු පිළිබඳ පවතින ප්‍රමාණවත් නොමැති දැනුම මෙම

ගැටලු හා බැඳී තිබේ. දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම ඔවුන්ගේ සමස්ත වර්ධනය හා යහපැවැත්මට තීරණාත්මක වේ.

මන්දපෝෂණය ඉහළ ගිය ප්‍රදේශ විශේෂයෙන් ඉලක්ක කරමින් පෝෂ්‍යපදාර්ථ අතින් සමබර ආහාරවේලක් ලබා දීම අරමුණු කොටගත් පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන ආහාරවේලක් ලබා දීමේ වැඩසටහන් දියත් කිරීම ඇතුළු ළමා පෝෂණය ඉහළ නැංවීම සඳහා පරිපූර්ණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරනු ඇත.

දෙමාපියන් සහ රැකබලාගන්නන් අතර නිසි ආහාර පිළිවෙත්, මව්කිරි දීම සහ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීම් සහ අධ්‍යාපන ව්‍යාපාර පැවැත්වීමට කටයුතු කරනු ඇත. මෙම ව්‍යාපාර මගින් අඩු වියදම්, පෝෂ්‍යදායී ආහාර සහ ළමා පෝෂණය සඳහා හොඳම භාවිතයන් පිළිබඳ තොරතුරු බෙදා හැරීමට කටයුතු කරනු ඇත.

වතුකර ක්ෂේත්‍රයේ දරුවන්ට එන්නත් සහ සෞඛ්‍ය පරීක්ෂණ වැනි රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවන් පහසුවෙන් ලබා ගත හැකි බව සහතික කිරීමට රජය සෞඛ්‍ය බලධාරීන් සමග කටයුතු කරනු ඇත. මන්දපෝෂණයෙන් පෙළෙන හෝ නිදන්ගත සෞඛ්‍ය තත්ත්වයන් ඇති දරුවන් සඳහා විශේෂිත සෞඛ්‍ය සේවා සැපයීමට අමතර ප්‍රයත්නයන් ක්‍රියාත්මක වනු ඇත.

### 9.4 ළමා මෙහෙකාර සේවය වැළැක්වීම

ආර්ථික පීඩනයන් හමුවේ පාසල් අධ්‍යාපනය වෙනුවට මෙහෙකාරකම් කිරීමට දරුවන්ට සිදුවන සන්දර්භයක් තුළ, ළමා මෙහෙකාර සේවය වතුකර ක්ෂේත්‍රයේ පවතින දැවෙන ගැටලුවක් බවට පත්ව තිබේ. මෙමගින දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා ඔවුනට තිබෙන අයිතිය අහිමි වනවා පමණක් නොව භයානක හා සූරාකෑමට ලක්වන කාර්ය තත්ත්වයන්වලට ඔවුන් නිරාවරණයවීම සිදුවේ. ළමා මෙහෙකාර සේවය මුලිනුපුටා දැමීමට සහ මෙහෙකාර සේවයේ යෙදීමකින් තොරව සියලු දරුවන්ට අධ්‍යාපනය ලැබීමට සහ සංවර්ධනය වීමට අවස්ථාව ලබාදීම සහතික කිරීම සඳහා රජය කැපවී සිටියි.

වතුකර ක්ෂේත්‍රය තුළ පවතින සියලුම ආකාරයේ ළමා මෙහෙකාර සේවාවන් තුරන් කිරීම සහතික කරමින් පවතින ළමා කම්කරු නීති බලාත්මක කිරීම ශක්තිමත් කිරීමට ද රජය විසින් කටයුතු කරනු ඇත.

වයස අවුරුදු 16 සහ ඊට වැඩි දරුවන්ට වැඩි වැඩියෙන් වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් පිරිනැමීමට සහ එමගින් ඔවුනට සේවා නියුක්තිය සඳහා විකල්ප මාර්ග සපයා දීම සහ ඔවුන් රැකියා සඳහා පාසල හැර යාමේ සම්භාවිතාව අඩු කිරීමට රජය කටයුතු කරනු ඇත.

### 9.5 බහු පාර්ශ්වික සහයෝගීත්වය

වතුකර ක්ෂේත්‍රයේ දරුවන් විසින් මුහුණදෙනු ලබන සංකීර්ණ අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා අධ්‍යාපනය, සෞඛ්‍යය, නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ සමාජ සේවාවන් ඇතුලු බහු පාර්ශ්වයන්ගේ සහයෝගීත්වය අවශ්‍ය වේ. ළමා සුබසාධනය සහ සංවර්ධන ප්‍රතිපත්තිවල ඵලදායීතාවය සහතික කිරීම සඳහා සම්බන්ධීකරණයෙන් යුත් සහ ඒකාබද්ධ ප්‍රවේශයක් අත්‍යවශ්‍ය බවට රජය විසින් හඳුනාගෙන තිබේ.

ළමා සුබසාධන සහ ආරක්ෂණ ගැටලුවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා රජයේ ආයතන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, අධිකරණය, කම්කරු පරීක්ෂකවරුන්, සේවායෝජකයන්, වෘත්තීය සමිති, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා නායකයන් ඇතුලු අදාළ සියලුම පාර්ශ්වකරුවන් ගේ ධාරිතාවය ගොඩනංවා ඔවුන් අතර සම්බන්ධීකරණය ඉහළ දැමීමට රජය කටයුතු කරනු ඇත. මෙමගින් ළමා ආරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීම සහ ළමා සුබසාධන සේවා වතුකර ක්ෂේත්‍රය පුරා ඵලදායී ලෙස ලබාදීම සහතික කෙරේ.

## 10 පරිච්ඡේදය

### *තාරුණ්‍යය සවිබල ගැන්වීම*

වතුකර ප්‍රජාවේ තාරුණ්‍යය ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා තීරණාත්මක සම්පතක් නියෝජනය කරනු ලබයි. කෙසේවෙතත්, වතුකර ක්ෂේත්‍රයේ තරුණයන් ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා පවතින සීමිත ප්‍රවේශය, රැකියා අවස්ථා නොමැතිකම සහ සමාජීය හා ආර්ථික ආන්තිකරණයට ලක්වීම ආදී සැලකිය යුත් මට්ටමේ අභියෝගයන්ට මුහුණ දෙති. මෙම අභියෝග බොහෝවිට ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනීමට සහ සිය ප්‍රජාවන්ගේ සහ මෙරට සංවර්ධනයට දායක වීමට ඇති හැකියාවට බාධා පමුණුවයි. තාරුණ්‍යය සවිබල ගැන්වීමේ වැදගත්කම හඳුනා ගනිමින් මෙම අභියෝග ආමන්ත්‍රණය කරන සහ සාර්ථකත්වය සඳහා අවශ්‍ය මෙවලම්, සම්පත් සහ අවස්ථා තරුණ පුද්ගලයන් වෙත ලබා දෙන ප්‍රතිපත්තීන් සහ වැඩසහටන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

**10.1 අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා ඇති ප්‍රවේශය**

අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව, වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන් සඳහා ආර්ථික සවිබල ගැන්වීම් සහ ඉහළ ගතිකයන් සඳහා වන තීරණාත්මක මංපෙත් විවර කරනු ලබයි. කෙසේවෙතත්, මූල්‍යමය බාධක, යටිතල පහසුකම් නොමැතිකම සහ අඩු වයසින් ශ්‍රම බලකායට ඇතුල් කිරීමට එල්ලවන සමාජ බලපෑම් හේතුවෙන් බොහෝ තරුණ පුද්ගලයෝ මෙම අවස්ථාවන්ට ප්‍රවේශවීමේ දී බාධකවලට මුහුණ දෙති. තරුණ පුද්ගලයන් හට අර්ථවත් වෘත්තීන්වල නියැලීමට සහ ඔවුන්ගේ සමාජ, ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් සහ වෘත්තීය පුහුණුව සඳහා පවතින ප්‍රවේශය සහතික කිරීම අත්‍යවශ්‍ය බව රජය විසින් හඳුනාගෙන තිබේ.

නව අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම, පවතින පාසල් වැඩිදියුණු කිරීම සහ සියලුම තරුණ පුද්ගලයන්ට ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඔබ්බට අධ්‍යාපනය කරගෙනයාමට හැකිවීම සහතික කිරීම සඳහා ශිෂ්‍යත්ව සහ මූල්‍ය ආධාර ලබාදීම තුළින් වතුකර ක්ෂේත්‍රයේ ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපනය සඳහා පවතින ප්‍රවේශය පුළුල් කිරීමට රජය කටයුතු කරනු ඇත.

දේශීය සහ ජාතික රැකියා වෙළෙඳපොළ තුළ ඉල්ලුමක් පවතින කුසලතා කෙරෙහි අවධානය යොමු කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන්වලට තොරතුරු තාක්ෂණය, සත්කාරකත්වය, නිෂ්පාදන, කෘෂිකර්මය සහ ව්‍යවසායකත්වය වැනි ක්ෂේත්‍රවල පුහුණුව ඇතුළත් වේ.

වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන්ගේ සුවිශේෂී අවශ්‍යතා සහ තත්ත්වයන්ට සරිලන පරිදි මාර්ගගත හා දුරස්ථ අධ්‍යාපනය ඇතුළු නම්‍යශීලී සහ විකල්ප අධ්‍යාපන මාර්ග ප්‍රවර්ධනය කිරීමට රජය විසින් කටයුතු කරනු ඇත. සාම්ප්‍රදායික පාසල්වලට හෝ පුහුණු මධ්‍යස්ථානවලට යාමට නොහැකි තරුණ පුද්ගලයන්හට තවමත් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අවස්ථා සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා මෙය ඉවහල් වනු ඇත.

**10.2 සේවා නියුක්තිය සහ ව්‍යවසායකත්වය සඳහා පවතින අවස්ථා**

බොහෝ විට ආර්ථික අවස්ථා අඩු වැටුප් සහ අනතුරුදායක රැකියාවලට සීමා කරන සන්දර්භයක් තුළ, වතුකර ක්ෂේත්‍රයේ තරුණ විරැකියාව ප්‍රධාන අභියෝගයක් ව පවතියි. බොහෝ තරුණ පුද්ගලයන්ට රැකියා සොයා නාගරික ප්‍රදේශවලට සංක්‍රමණයවීමට සිදුවන අතර තම ප්‍රජාවන් අතහැර යාමට සිදුවේ. මෙම තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවල බුද්ධිගලනයට හේතු වී තිබේ. වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන්හට තිරසාර රැකියා සහ ව්‍යවසායකත්ව අවස්ථා උදාකර දෙමින් සාර්ථක වෘත්තීන් ගොඩනැගීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ගේ ආර්ථික සංවර්ධනයට දායකවීමට රජය කැපවී සිටියි.

වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන්හට නව රැකියා අවස්ථා බිහි කිරීම සඳහා පෞද්ගලික අංශ, සිවිල් සමාජය සහ සංවර්ධන හවුල්කරුවන් සමග එක්ව රජය කටයුතු කරනු ඇත. තොරතුරු තාක්ෂණය, සංචාරක කර්මාන්තය සහ පුනර්ජනනීය බලශක්තිය වැනි නැඟී එන කර්මාන්තවල මෙන්ම කෘෂිකර්මය සහ නිෂ්පාදන වැනි සාම්ප්‍රදායික අංශවල රැකියා උත්පාදනය ප්‍රවර්ධනය කිරීම මීට ඇතුළත් වනු ඇත.

තාරුණ්‍යය සවිබල ගැන්වීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කෙරෙනු ඇත. රජය විසින් තරුණ ව්‍යවසායකයන්ට තමාගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ ඒවා වර්ධනය කිරීමට හැකි වන පරිදි පුහුණුව, උපදේශනය සහ ණය පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දෙනු ඇත. බොහෝ විට ව්‍යාපාර හිමිකාරිත්වය සහ මූල්‍ය ස්වාධීනත්වය හමුවේ අමතර බාධකවලට මුහුණ දෙන තරුණ කාන්තා ව්‍යවසායකයන්ට සහායවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.

ව්‍යාපාර ජනනය, ආරම්භක තරග සහ උපදේශන වැඩසටහන් ඇතුලුව තරුණ ව්‍යවසායකත්ව මුලපිරීම්වලට සහාය දැක්වීම සඳහා රජය සහ පෞද්ගලික අංශවල හවුල්කාරිත්වයන් ස්ථාපිත කෙරෙනු ඇත. මෙම හවුල්කාරිත්වයන් තරුණ ව්‍යවසායකයන් සම්පත්, ජාල සහ වෙළඳපොළ සමග සම්බන්ධ කිරීමට උපකාරී වනු ඇති අතර එමගින් ඔවුනට සාර්ථකත්වය සඳහා පවතින අවස්ථා ඉහළ නංවනු ඇත.

### 10.3 නායකත්වය සහ සිවිල් සහභාගීත්වය

බොහෝ විට වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන්හට තීන්දුතීරණ ගැනීමේ ක්‍රියාවලීන්වල නියෝජනයක් නොමැති බවත්, නායකත්ව අවස්ථාවලින් ඔවුන් බැහැර කර ඇති බවත් රජය පිළිගනු ලබයි. මෙම ආන්තිකකරණය ඔවුන්ගේ ජීවිතයට බලපාන ප්‍රතිපත්ති සහ වැඩසහටන්වලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සීමා කරන අතර ඔවුන්ගේ ප්‍රජාවන්ගේ සංවර්ධනයට දායක වීමට ඇති හැකියාවට ද බාධා පමුණුවයි. තරුණ පුද්ගලයන් අතර නියෝජනයක් පැවතීම සහ වගකීම පිළිබඳ හැඟීමක් ඇති කරවීම සඳහා මෙන්ම ශක්තිමත් වඩාත් ප්‍රත්‍යාස්ථ ප්‍රජාවන් ගොඩනැගීම සඳහා නායකත්ව භූමිකාවන් භාර ගැනීමට සහ සිවිල් ජීවිතයට සහභාගීවීමට තරුණ පුද්ගලයන් සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය කරුණක් බව රජය විසින් හඳුනාගෙන තිබේ.

වතුකර ක්ෂේත්‍රයේ තරුණ සහභාගීත්වය සඳහා සිවිල් අවකාශයන් ශක්තිමත් කිරීමට රජය කටයුතු කරනු ඇත. තාරුණ්‍යයට තම අදහස් ප්‍රකාශ කිරීමට, ප්‍රජා ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට සහ ඔවුන්ට බලපාන ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දායකවීමට හැකි බව සහතික කිරීම මීට ඇතුළත් වනු ඇත.

ප්‍රතිපත්ති සම්පාදකයන් සමග අර්ථවත් සංවාදයක යෙදීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ගේ සහ ජාතියේ සංවර්ධනයට දායකවීමට තරුණ පුද්ගලයන්ට අවස්ථාවන් ඇති බව සහතික කරමින්, දේශීය මට්ටමින් තරුණ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සිවල් සමාජ සංවිධාන සහ ප්‍රජා නායකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට රජය ක්‍රියාකරනු ඇත.

### 10.4 සමාජීය පරිපූර්ණභාවය සහ මානසික සෞඛ්‍යය

වතුකර ක්ෂේත්‍රයේ බොහෝ තරුණ පුද්ගලයෝ තම ජනවාර්ගිකත්වය, සමාජ, ආර්ථික තත්ත්වය හෝ සමාජභාවය මත සමාජයෙන් කොන්වීමට සහ වෙනස්කොට සැලකීමට ලක්වෙති. මෙසේ සමාජයෙන් බැහැරවීමට ලක්වීම මත හුදකලාව, අඩු ආත්මාභිමානය සහ දුර්වල මානසික සෞඛ්‍ය තත්ත්ව වැනි ප්‍රතිඵල ඇතිවිය හැකිය. වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන් අතර සමාජීය පරිපූර්ණභාවය සහ මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනාගන්නා රජය, සියලු තරුණ පුද්ගලයන්හට සිය සම්පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා වටිනාකමක්, සහයෝගයක් සහ සවිබල ගැන්වීමක් ලබාදීම සහතික කරනු ලබයි.

වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන්ට වෙනස්කොට සැලකීම අවම කිරීමට සහ සමාජීය පරිපූර්ණභාවය ප්‍රවර්ධනය කිරීමට රජය විසින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩසටහන් මගින් තරුණ පුද්ගලයන් අතර අයිතියේ හැඟීමක් සහ ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කරනු ඇති අතර වෙනස්කොට සැලකීමේ සහ සමාජීය වශයෙන් කොන් කිරීමේ ඵලවිපාක පිළිබඳව දැනුවත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

ආතතිය, කාංසාව, විෂාදිය, මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් මානසික සෞඛ්‍ය අභියෝගවලට මුහුණදෙන තරුණ පුද්ගලයන්හට සහාය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින් වතුකර ක්ෂේත්‍රයේ මානසික සෞඛ්‍ය සේවාවන් පුළුල් කිරීමට කටයුතු කරනු ඇත. මෙම සේවාවන්ට පාසල් සහ ප්‍රජා මධ්‍යස්ථානවල උපදේශන, සහචර සහාය කණ්ඩායම් සහ මානසික සෞඛ්‍ය අධ්‍යාපනය සහ පුනරුත්ථාපන වැඩසටහන් ඇතුළත් වනු ඇත.

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන්, ශාරීක ක්‍රියාරකම් සහ නිර්මාණාත්මක ප්‍රකාශනයන් දිරිමත් කරන වැඩසටහන්වලට සහාය දීම හරහා ධනාත්මක තරුණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ද රජය කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන් තරුණ පුද්ගලයන් අතර ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීමට සහ ඔවුන්ගේ ශක්තිය හා නිර්මාණශීලීත්වය උදෙසා හිතකර වේදිකාවන් සපයාදීමට ඉවහල්වනු ඇත.

10.5 **ක්‍රීඩා සහ භෞතික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය**

ශාරීරික සෞඛ්‍යය පමණක් නොව මානසික යහපැවැත්ම, කණ්ඩායම් ක්‍රියාකාරකම්, විනය සහ නායකත්ව කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සහ ශාරීරික ක්‍රියාකාරකම් දියත් කිරීම තාරුණ්‍යයේ පරිපූර්ණ සංවර්ධනය උදෙසා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෙසේවෙතත්, වතුකර ක්ෂේත්‍රය තුළ ක්‍රීඩා පහසුකම් සහ සංවිධානාත්මක ක්‍රීඩා වැඩසටහන් සඳහා ප්‍රවේශය බොහෝ විට සීමා වී ඇති අතර එමගින් තරුණ පුද්ගලයන්හට මෙම වටිනා අවස්ථා අහිමි වී ගොස් තිබේ.

තාරුණ්‍යය සවිබල ගැන්වීම සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා මෙවලමක් ලෙස ක්‍රීඩාවේ පවතින වැදගත්කම රජය විසින් හඳුනාගෙන තිබෙන අතර, වතුකර ප්‍රජාවේ තරුණ සංවර්ධනය සඳහා වන පුළුල් උපායමාර්ගයේ කොටසක් ලෙස ක්‍රීඩා සහ ශාරීරික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා රජය කැපවී සිටියි.

ක්‍රීඩා පිටි, ක්‍රීඩා කලාප සහ ප්‍රජා මධ්‍යස්ථාන ඇතුලු වතුකර ක්ෂේත්‍රයේ ක්‍රීඩා පහසුකම් ගොඩනැගීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට රජය කැපවී සිටියි. මෙම පහසුකම් සඳහා සියලුම තරුණ පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි අතර විනෝදාත්මක ක්‍රියාකාරකම්, කණ්ඩායම් ක්‍රීඩා සහ යෝග්‍යතා වැඩසටහන් සඳහා ආරක්ෂිත වටපිටාවන් සපයනු ඇත.

වතුකර කලාපවල ජාතික ක්‍රීඩා වැඩසටහන් සහ තරඟ සංවිධානය කිරීම සහ ඒවාට වතුකර ක්ෂේත්‍රයේ තරුණ පුද්ගලයන් සහභාගී කරවා ගනිමින් ඔවුන්ගේ දක්ෂතා පෙන්වීමට සහ ජාතික වේදිකාවක් මත තම ප්‍රජාව නියෝජනය කිරීමට අවස්ථාව සළසා දීම ප්‍රවර්ධනය කිරීමට ද රජය කටයුතු කරනු ඇත. ක්‍රීඩා වැඩසටහන් සහ පහසුකම් සඳහා ගැහැනු දරුවන්ට සහ තරුණියන්ට සමාන ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් මෙහිදී යොමු කෙරෙනු ඇත.

හැකියා හා දක්ෂතා පෙන්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා උපකරණ, පුහුණුව සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ඇතුලු වතුකර ක්ෂේත්‍රයේ ක්‍රීඩා සංවර්ධනයට සහාය වීම සඳහා ක්‍රීඩා සංවිධාන, සිවිල් සමාජය සහ පෞද්ගලික අංශයේ අනුග්‍රාහකයන් සමග හවුල්කාරීත්වය ප්‍රවර්ධනය කිරීමට ද රජය කටයුතු කරනු ඇත.

## 11 පරිච්ඡේදය

### *කාන්තා සවිබල ගැන්වීම සහ සමාජභාවී සමානාත්මතාවය*

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සහ පුළුල් ආර්ථිකයට වතුකර ප්‍රජාවේ ජීවත්වන කාන්තාවන් විසින් සිදුකර ඇති මෙහෙය සුවිශේෂීය. මෙය වැඩි වශයෙන් නිරීක්ෂණය කළ හැක්කේ තේ කර්මාන්තය තුළ ය. එතරම් දායකත්වයක් ඔවුන් විසින් ලබා දුන්නද බොහෝ විට වෙනස් කොට සැලකීම්, සූරාකෑමට ලක්වීම් සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (gender-based violence) ආදී සිදු වීම් වලට මුහුණ දීමට කාන්තාවන්ට සිදුවේ.

සමාජභාවී සමානාත්මතාවය (gender equality) ප්‍රවර්ධනය කිරීම සහ සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම මඟින් වතුකර ප්‍රජාවේ ජීවත්වන කාන්තාවන්ගේ සමාජ තත්ත්වයට පිළිගැනීම ලබා දීමට හා වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටියි.

#### 11.1 දායකත්වයට පිළිගැනීම ලබා දීම

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන කාන්තාවන් විසින් ඉටු කරනු ලබන තීරණාත්මක භූමිකාව සඳහා නිල වශයෙන්ම පිළිගැනීමක් ලබාදීමට රජය කටයුතු කරයි. විශේෂයෙන්ම තේ කර්මාන්තය ඇතුලු වතුකර ක්ෂේත්‍රය තුළ ඔවුන් විසින් ලබා දී තිබෙන ශ්‍රමය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මුල්ගල් තැබීම බවට සැලකිය හැකිය.

ජාතික ආර්ථික ප්‍රතිපත්තීන්වල මෙකී දායකත්වයන් සඳහා පිළිගැනීමක් ලබා දීමට මෙන්ම කාන්තාවන්හට සාධාරණ වැටුප් හා කාර්ය තත්ත්වයන් ලබා දීම සහතික කිරීමට රජය කැපවී සිටියි.

කුසලතාව, තථ්‍යතාව, සහ සංස්ථිතිය ආදී හැකියාවන් අවශ්‍ය වන තේ දළු නෙලීම වැනි ශාරීරික වශයෙන් ශ්‍රමය වැය කිරීමට සිදුවන කර්තව්‍යයන් ඉටු කරන වතුකර ප්‍රජාවේ ජීවත්වන කාන්තාවන් ඓතිහාසික වශයෙන් මෙරට තේ කර්මාන්තයේ කොඳු නාරටිය බවට පත්ව තිබේ. ගෝලීය වෙළඳ පොළ තුළ ශ්‍රී ලංකාවේ තේවල ගුණාත්මකභාවය සහ කීර්ති නාමය පවත්වා ගැනීම සඳහා ඔවුන් විසින් ලබා දී තිබෙන මෙහෙවර තීරණාත්මක වන අතර ඔවුන්ගේ ශ්‍රමය තුළින් සැලකිය යුතු මට්ටමක ආදායමක් මෙරටට ජනිත කොට තිබේ.

ආර්ථිකය හමුවේ ඔවුන්ගේ තීරණාත්මක භූමිකාව එසේ පැවතිය ද, වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ වටිනාකම බොහෝ විට අවතක්සේරුවට ලක්වන අතර ඔවුනට සුදුසු වැටුපක් ලබා දීම සිදු නොවේ. මෙමගින් දියුණුව සඳහා ඔවුනට ඇති අවස්ථා සීමාකර තිබේ. වතුකර ක්ෂේත්‍රයේ ජීවත් වන කාන්තාවන් වෙනුවෙන් පිළිගැනීම ලබා දීම සහ ඔවුන්ගේ දායකත්වයන්ට අදාල ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම මඟින් උක්ත අසාධාරණය ආමන්ත්‍රණය කිරීමට රජය කැපවී සිටියි. සමාන සේවා සඳහා සමාන වැටුප් ලබා දීම, පුහුණුව හා සංවර්ධන අවස්ථා සඳහා ප්‍රවේශය ඇති කිරීම සහ නායකත්ව කාර්ය භාරයන් සඳහා කාන්තාවන්ට සහාය ලබා දීම ඇතුලු, රැකියා ස්ථානය තුළ සමාජභාවී සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම මීට ඇතුළත් වනු ඇත.

ජාතික ආර්ථික ප්‍රතිපත්තීන් සහ සංවර්ධන සැලැස්මවල වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ දායකත්වය සඳහා පිළිගැනීම ලබා දීම සහ සැමරුමට ලක් කිරීම සහතික කිරීමට ද රජය කටයුතු කරනු ඇත. කාන්තාවන් විසින් ලබා දෙන සේවය දැකීමට සැලැස්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා මුලපිරීම් දියත් කිරීම මෙන්ම ආර්ථිකය තුළ සමාජභාවී සමානාත්මතාවය (gender equality) පැවතීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ප්‍රයත්නයන් දියත් කිරීම මීට ඇතුළත්ය.

#### 11.2 සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (Gender-Based Violence) මුලිනුපුටා දැමීම

සූරා කෑමට ලක්වීම, කෙණහිලිකම් වලට මුහුණදීම සහ අපයෝජනයට ලක්වීම ආදී සිදුවීම් හමුවේ බොහෝ විට කාන්තාවන් අවදානමට ලක්වන සන්දර්භයක් තුළ, වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන් මුහුණ දෙනු ලබන සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (gender-based violence) දැවෙන ගැටළුවක් බවට පත්ව තිබේ. එවන් සිදුවීම් වැළැක්වීම, ආරක්ෂාව ලබා දීම සහ දිවි ගලවාගත් අයට සහයෝගය ලබා දීම ආදී කරුණු ඇතුළත් පරිපූර්ණ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හරහා මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීමට රජය කැපවී සිටියි.

වතුකර ප්‍රජාව තුළ හටගන්නා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ආමන්ත්‍රණය කිරීම සඳහා පරිපූර්ණ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට රජය විසින් කටයුතු කරනු ඇත. මෙම ප්‍රතිපත්තිය, කාන්කා සවිබල ගැන්වීම හා සමාජභාවී සමානාත්වමතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට (National Policy on Womens Empowerment and Gender Equality) අනුකූලව සම්පාදනය වනු ඇත. සමූහ රෝහල් තුළ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන ඒකක (GBV response unit) පිහිටුවීම, දිවිගලවාගත් අයට නීතිමය සහාය ලබා දීම සහ කාන්තා හිමිකම් සහ සමාජභාවී සමානාත්මතාවයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි මුල පිරීම් ඔස්සේ ප්‍රජාව දැනුවත් කිරීම මීට ඇතුළත් වනු ඇත.

සමූහ රෝහල් වල සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන ඒකක පිහිටුවීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයකි. වෛද්‍ය සේවාවන්, මනෝවිද්‍යාත්මක උපදේශනය සහ නීතිමය සහාය සැපයීම වැනි සේවාවන් ලබා දීම තුළින් සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවාගත් අයට ආරක්ෂිත හා සහයෝගීමත් පරිසරයක් මෙම ඒකක වෙතින් ලබා දෙනු ඇත. මෙවන් සිදුවීම් වලට වගකිව යුතු තැනැත්තන් නීතිය ඉදිරියට ගෙන ඒම සහ දිවි ගලවාගත් අයගේ ජීවිත යළි ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහතික කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන හා ප්‍රජා සංවිධාන සමග එක්ව කටයුතු කිරීමට ද මෙම ඒකක කටයුතු කරනු ඇත.

මෙම ප්‍රතිචාර දැක්වීමේ සේවාවන්ට අමතරව කාන්තා හිමිකම් සහ සමාජභාවී සමානාත්මතාවයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ ප්‍රජාව දැනුවත් කිරීම තුළින් එවන් සිදුවීම් හටගැනීම වැළැක්වීමට ද රජයේ අවධානය යොමුවනු ඇත. සමාජභාවය පිළිබඳ හානිකර ඒකාකෘතීන්, වෙනස්කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය ඉවසා සිටීම වැනි සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට හේතු වන ආකල්ප හා චර්යා වෙනස් කිරීම මෙම ව්‍යාපාර වල ඉලක්කය වී තිබේ. කාන්තා හිමිකම් ආරක්ෂා කිරීම සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය නෛතික රාමු සහ ඒවා බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට ද රජය කටයුතු කරනු ඇත.

සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ගොඩනැගෙන පරිපූර්ණ ප්‍රතිපත්තිය, වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන කාන්තාවන් හට වඩාත් ආරක්ෂිත සහ සහයෝගීමත් පරිසරයක් නිර්මාණය කිරීමට උපකාරීවනු ඇති අතර ශ්‍රී ලංකාව තුළ සමාජභාවී සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමේ පුළුල් අභිමතාර්ථය සඳහා ද දායකවනු ඇත.

**11.3 කාන්තාවන්ගේ සමාජ - ආර්ථික සවිබල ගැන්වීම**

වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ සමාජ තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා සමාජ, ආර්ථික සවි බල ගැන්වීම ප්‍රධාන උපාය මාර්ගයකි.ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, ණය පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දීම සහ මූල්‍ය කළමනා කරණය සහ ව්‍යාපාර සංවර්ධනය වැනි කුසලතා සඳහා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම ආදිය තුළින් කාන්තාවන්ගේ සමාජ - ආර්ථික සවි බල ගැන්වීම සඳහා රජයේ සහාය හිමිවනු ඇත. මෙම මුලපිරීම් ඔස්සේ කාන්තාවන්ට තමාගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ මූල්‍ය ස්වාධීනත්වය ලබා ගැනීමට ඉවහල් වනු ඇත. මෙම වැඩසටහන් සම්පාදනය කොට තිබෙන්නේ මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය, සමාජ හා සංස්කෘතික බාධක සහ රැකියාව හා පවුලේ වගකීම් අතර තුලනයක් පවත්වා ගැනීම ආදී කරුණු හා බැඳී පවතින වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන සුවිශේෂී අවශ්‍යතා හා අභියෝග ද ආමන්ත්‍රණය කළ හැකි පරිදිය. .තමාගේම ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සම්පත් කාන්තාවන්ට සැපයීම තුළින් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම, ආර්ථික සුරක්ෂිත භාවය වැඩිදියුණු කිරීම සහ වතු කම්කරු සේවය මත යැපීම අවම කිරීම රජය ඉලක්ක කරනු ලබයි.

කාන්තාවන්ගේ අවශ්‍යතාවලට සරිලන ක්ෂුද්‍ර මුල්‍ය ණය පහසුකම් සහ වෙනත් මූල්‍ය නිෂ්පාදන ඇතුලු කාන්තා ව්‍යවසායකයන් හට ණය පහසුකම් වෙත තිබෙන ප්‍රවේශය වැඩි දියුණු කර දීම සඳහා රජය මූල්‍ය ආයතන සමග ද කටයුතු කරනු ඇත.

ව්‍යවසායකත්වයට අමතරව වෙනත් අංශවල සේවා නියුක්තිය සහ ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මුලපිරීම් දියත් කිරීම මඟින් රජය කාන්තාවන්ගේ සමාජ, ආර්ථික සවිබල ගැන්වීම වෙනුවෙන් සහාය ලබා දෙනු ඇත. මේ සඳහා කාන්තාවන්ට නිෂ්පාදන, සේවා හෝ සංචාරක කර්මාන්තය වැනි අංශ වල රැකියා සඳහා අවශ්‍ය වන නව කුසලතා පුහුණු කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීම මෙන්ම එකී අංශවල කාර්ය තත්ත්වයන් සහ වැටුප් වැඩිදියුණු කිරීම ආදිය ඇතුළත් කළ හැකිය.

වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ සමාජ - ආර්ථික සවිබල ගැන්වීම, ඔවුන්ගේ පුද්ගල යහ පැවැත්ම සඳහා වැදගත් වනවා පමණක් නොව ඒ ඒ කලාපයන්වල පුළුල් ආර්ථික සංවර්ධනය සඳහා ද තීරණාත්මක පියවරකි. ආර්ථිකය තුළ කාන්තා සහභාගීත්වය ඉහළ දැමීම තුළින් නව ආදායම් මාර්ග සහ සේවා නියුක්තීන් බිහි කිරීමට මෙන්ම දරිද්‍රතාවය අවම කොට පරිපූර්ණභාවයෙන් යුතු තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීමට රජය ඉලක්ක කරනු ලබයි.

11.4 වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම

වතුකර ප්‍රජාවේ ජීවත්වන කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම සඳහා රජය කැපවී සිටියි. අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ රැකියා අවස්ථා සඳහා පවතින සමාන ප්‍රවේශය සහතික කිරීම මීට ඇතුළත්ය. අසමාන වැටුප් සහ රැකියා වියුක්තියට ඇද දැමීම වැනි සේවා ස්ථානය තුළ පවතින වෙනස් කොට සැලකීමේ ප්‍රයත්නයන් මුලිනුපුටා දැමීමට ද රජය කටයුතු කරනු ඇත.

කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම, ඔවුන්ගේ සමාජීය හා ආර්ථික උන්නතිය අරභයා පවතින ප්‍රධාන බාධකයක් බවට රජය විසින් හඳුනාගෙන තිබේ. අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ රැකියා අවස්ථා සඳහා පවතින සමාන ප්‍රවේශය බොහෝ විට කාන්තාවන්ට අහිමිවන අතර අසමාන වැටුප් සහ රැකියා වියුක්තියට ඇද දැමීම වැනි සේවා ස්ථානය තුළ පවතින වෙනස් කොට සැලකීම් වලට මුහුණ දෙන ඔවුනට තම උන්නතිය උදෙසා පවතින අවස්ථාවන් ද සීමිතය.

සමාජභාවී සමානාත්මතාවය උදාකර ගැනීම සහ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික සංවර්ධනයට පූර්ණ වශයෙන් සහභාගී වීම සහ එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට කාන්තාවන්ට අවස්ථාව ලබා දීම, වතුකර ක්ෂේත්‍රයේ කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම මුලිනුපුටා දැමීම කෙරෙහි අත්‍යාවශ්‍ය සාධක වේ. වෙනස්කොට සැලකීම් පසුපස පවතින මූලාරම්භ හඳුනාගෙන ඒවා ආමන්ත්‍රණය කොට සමාන අයිතීන් හා අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම තුළින් සැමට වඩාත් සාධාරණ හා යුක්ති සහගත සමාජයක් බිහි කිරීමට රජය ඉලක්ක කරනු ලබයි.

## 12 පරිච්ඡේදය

### *අවදානමට ලක්ව ඇති කණ්ඩායම්වල පරිපූර්ණ භාවය*

වතුකර ප්‍රජාව තුළ තම සමාජ තත්ත්වය, අනන්‍යතාවය හෝ ශාරීරික හැකියාවන් මත සංකීර්ණ අභියෝගවලට මුහුණ දෙන විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සිටින බව ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන තිබේ. මේ අතර උග්‍ර දරිද්‍රතාවයෙන් ජීවත්වන පුද්ගලයෝ, ආබාධිත තත්ත්ව හෝ සෞඛ්‍ය තත්ත්වයන්ගෙන් පසුවන පුද්ගලයෝ සහ විවිධ ලිංගික දිශානතීන් සහ සමාජභාවී අනන්‍යතාවයන් පවතින පුද්ගලයෝ සිටිති. මෙවන් අවදානම් කණ්ඩායම් නිරතුරුව වෙනස් කොට සැලකීම්වලට, ආන්තිකකරණයට, හා තම ප්‍රජාව තුළම කොන්වීමට ලක්වන බව රජය විසින් හඳුනාගෙන තිබේ. එවන් සියලු අවදානම් කණ්ඩායම් සඳහා පූර්ණ පරිපූර්ණ භාවය සහ ආරක්ෂාව සැපයීමට සහ පුද්ගලයකුගේ සමාජ තත්ත්වය, අනන්‍යතාවය, සෞඛ්‍යය හෝ හැකියාවන් කුමක් වුවද ඔවුනට ජාතියේ සංවර්ධනයට පූර්ණ වශයෙන් සහභාගී වීමට සහ එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකියාව ලැබීම සහතික කිරීමට රජය කැපවී සිටියි.

සාධාරණ සමාජයක් බිහි කිරීමෙහිලා අවදානම් කණ්ඩායම්වල පරිපූර්ණ භාවය තීරණාත්මක අංගයකි. වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන එවන් පුද්ගලයන් මුහුණ දෙනු ලබන සුවිශේෂී අභියෝගයන් ආමන්ත්‍රණය කිරීම තුළින් සෑම පුද්ගලයකුටම වටිනාකමක් හා ගරුත්වයක් ලබා දෙන වඩාත් පරිපූර්ණ භාවයෙන් යුතු සහ යුක්ති සහගත සමාජයක් බිහි කිරීම රජයේ ඉලක්කය වී තිබේ.

#### 12.1 පරිපූර්ණ භාවයෙන් යුතු පරිසරයක් ගොඩනැඟීම

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන අවදානම් කණ්ඩායම් අධ්‍යාපනය, සේවා නියුක්තිය, සෞඛ්‍ය සේවා, සහ රජයේ සේවා වෙත ප්‍රවේශය ලබා ගැනීමෙහිලා සැලකිය යුතු මට්ටමකින් බාධකවලට මුහුණ දෙති. මෙවන් බාධක බොහෝ විට අප කීර්තිය සහ වෙනස්කොට සැලකීම මත පදනම් වූ ඒවා වන අතර මෙමගින් ඔවුනට සමාජය තුළ පූර්ණ වශයෙන් සහභාගීත්වයක් ලබා ගැනීමට ඇති ඉඩ අවකාශ ඇහිරී යයි.
සියලු පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන සහ ජාතියේ සංවර්ධනය තුළ කිසිවකු මඟහැර නොයන පරිපූර්ණ භාවයෙන් යුතු සමාජයක් ගොඩ නැඟීමේ අවශ්‍යතාව රජය විසින් හඳුනාගෙන තිබේ.

#### 12.2 සමාජ සේවාවන් සහ නෛතික ආරක්ෂාවන් සඳහා ඇති ප්‍රවේශය

වතුකර ක්ෂේත්‍රයේ ජීවත්වන අවදානම් කණ්ඩායම්වලට බොහෝ විට සමාජ සේවාවන් සහ නෛතික ආරක්ෂාවන් සඳහා පවතින්නේ සීමිත ප්‍රවේශයකි. මෙවන් සීමිත ප්‍රවේශයක් පැවතීම හේතුවෙන් බොහෝ විට සූරාකෑමට ලක්වීම, අපයෝජනයට ලක්වීම සහ නොසලකා හැර දැමීම වැනි තත්ත්වයන්ට මුහුණ දීමට ඔවුනට සිදු වේ. විශේෂයෙන්ම මෙවන් තත්ත්ව වලට අධි අවදානමක් පවතින පුද්ගලයන් ද ඇතුලුව වතුකර ප්‍රජාවගේ සියලු සාමාජිකයන්හට සුරක්ෂිත හා අභිමානවත් අන්දමින් ජීවත් වීම සඳහා අවශ්‍ය වන සේවාවන් හා ආරක්ෂාවන් ලබා දීම සහතික කිරීමේ අවශ්‍යතාවය රජය විසින් හඳුනාගෙන තිබේ.

වතුකර ක්ෂේත්‍රයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, නිවාස සහ නීතිමය සහාය ඇතුලු අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කිරීම සඳහා සමාජ සේවා සපයන්නන්, නීතිය ක්‍රියාත්මකකරන්නන් සහ ප්‍රජා සංවිධාන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමට රජය කැපවී සිටියි.

අවදානම් කණ්ඩායම් සඳහා නීතිමය ආරක්ෂාව ශක්තිමත් කෙරෙනු ඇති අතර මෙහි දී වෙනස් කොට සැලකීම, ප්‍රචණ්ඩත්වය සහ සූරාකෑම වැළැක්වීම කෙරේ අවධානය යොමු කෙරෙනු ඇත. එවන් පුද්ගලයන්ට යුක්තිය පසිඳලීමේ ප්‍රවේශය සහ පලි ගැනීම් හමුවේ බියෙන් තොරව සිය අයිතිවාසිකම් භුක්ති විඳීම කළ හැකි බව සහතික කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ නීති ආධාර සපයන්නන් සමග එක්ව කටයුතු කිරීමට රජය විසින් කටයුතු කරනු ඇත.

අවදානම් කණ්ඩායම්වලට සමාජීය පරිපූර්ණ භාවය ලබා දීම ප්‍රවර්ධනය කරන ප්‍රජා - මූලික මුල පිරීම් සඳහා රජය සහාය ලබා දෙනු ඇත. පුද්ගලයන්ට තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම වතුකර ප්‍රජාවේ විවිධ කොටස් අතර සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය සහයෝගය ගොඩනැඟීමට දරන ප්‍රයත්න මීට ඇතුළත් වනු ඇත.

**12.3 අවදානම් කණ්ඩායම් සවි බල ගැන්වීම සහ ඔවුන්ගේ සහභාගීත්වය**

සමාජීය පරිපූර්ණභාවය සහ යුක්තිය උදාකර ගැනීම සඳහා තීන්දු තීරණ ගැනීමේ ක්‍රමවේදවල අවදානම් කණ්ඩායම්වල සහභාගීත්වය සහතික කළ යුතු අතර ඒ වෙනුවෙන් එවන් කණ්ඩායම් සවිබල ගැන්වීම තීරණාත්මක පියවරකි. තම ගැටලු ඉදිරිපත් කිරීම සහ තම ජීවිතවලට බලපාන තීරණවලට සහභාගීවීම සඳහා බොහෝ විට අවදානම් කණ්ඩායම්වලට ලැබෙන්නේ සීමිත අවස්ථාවන්ය.

සියලු සමාජ පැතිකඩයන්වල සියලු ප්‍රජාවන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය සහතික කිරීම සඳහා රජය කැපවී සිටියි.

අවදානම් කණ්ඩායම් විසින් මුහුණ දෙනු ලබන සුවිශේෂී අභියෝග ආමන්ත්‍රණය කිරීමෙන් සහ ඔවුන්ගේ පරිපූර්ණභාවය සහ සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීමෙන් සෑම අයකුටම දියුණුවීමට සහ ජාතියේ ප්‍රගතියට දායකවීමට අවස්ථාව ඇති සමාජයක් බිහි කිරීම රජයේ අරමුණ වී තිබේ.

## 13 පරිච්ඡේදය

### *අනුස්මරණය සහ සංස්කෘතික සංරක්ෂණය*

වතුකර ප්‍රජාව පූර්ණ වශයෙන් පුළුල් සමාජයට ඒකාබද්ධ කරන අතරවාරයේ ඔවුන්ගේ ඉතිහාසය සහ සංස්කෘතික උරුමය අනුස්මරණය කොට සංරක්ෂණය කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන තිබේ. මේ අතර ඉන්දියානු සම්භවයක් සහිත දමිළ/ මලලෙයාහ දමිළ ප්‍රජාවගේ අසමසම අනන්‍යතාවයට පිළිගැනීමක් ලබාදීම සහ ඓතිහාසික වශයෙන් ඔවුන් ආන්තික කරණයට ලක්කිරීමට හේතු වූ සමාජීය ගැටලු ආමන්ත්‍රණය කිරීම ඇතුළත්ය.

**13.1 අනුස්මරණය සහ අනන්‍යතාවය**

වතුකර ප්‍රජාවගේ අනන්‍යතාව ඉන්දියානු දමිළ (IOT) / මලලෙයාහ දමිළ ලෙස සංරක්ෂණය කොට ඔවුන්ගේ ශ්‍රී ලංකා ආගමනය සිදුවී වර්ෂ 200 ක් සම්පූර්ණ වීම අනුස්මරණය කිරීමට රජය කටයුතු කරනු ඇත.

මෙම අනුස්මරණය, වතුකර ප්‍රජාවගේ දායකත්වයන්ට පිළිගැනීමක් ලබා දීමට සහ ඒ වෙනුවෙන් කෘතඥතාවය පුද කිරීමට අවස්ථාව සපයන අතර ගත වූ සියවස් දෙක තුළ ඔවුන් විසින් මුහුණ පෑ අභියෝග හා අසාධාරණයන් ද ආමන්ත්‍රණය කරනු ඇත.

වතුකර ප්‍රජාවගේ අනන්‍යතාවය ඉන්දියානු දමිළ (1OT) / මලලෙයාහ දමිළ ලෙස සංරක්ෂණය කොට ඔවුන්ගේ ඉතිහාසය සහ උරුමය ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවයේ අත්‍යාවශ්‍ය අංශයක් ලෙස පිළිගැනීමට බඳුන්කර සැමරීම සඳහා රජය කැපවී සිටියි. මේ සඳහා ජාතික විෂය නිර්දේශය ඔස්සේ කම්කරු ප්‍රජාව පිළිබඳ ඉගැන්වීම සහ ශ්‍රී ලංකාවේ කම්කරු ප්‍රජාවගේ ඉතිහාසය, අරගල සහ දායකත්වයන් අනුස්මරණය කරන ජාතික ඉතිහාස සතියක් ප්‍රකාශයට පත් කිරීම හා ඔවුන්ගේ ප්‍රජාවගේ සංස්කෘතික උරුමයන් සිහි කිරීම වැනි මුල පිරීම් ක්‍රියාවට නැංවිය හැකිය.

ඉතිහාසයේ මගහැර ගොස් තිබෙන කරුණු නිවැරදි කිරීම ශ්‍රී ලංකාවේ අතීතය පිළිබඳ වඩාත් පරිපූර්ණ භාවයෙන් යුතු අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම සහ ජාතිය පුරා ඉහළ සමාජීය ඒකාබද්ධතාවයක් හා එකමුතුකමක් නිර්මාණය කිරීමෙහිලා මෙවන් මුල පිරීම් උපකාර වේ.

**13.2 සංස්කෘතික සංරක්ෂණය සහ ප්‍රවර්ධනය**

වතුකර ප්‍රජාවගේ සංස්කෘතික උරුමය ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවයේ අතිශය වැදගත් අංගයක් වන අතර මෙම උරුමය අනාගත පරපුරු වෙනුවෙන් සංරක්ෂණය කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට රජය කැපවී සිටියි.

කම්කරු ප්‍රජාවගේ භාෂාවන්, සාම්ප්‍රදායන්, කලා හා ආගමික ක්‍රියාකාරකම් ආදී සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම සඳහා දියත් කරන ප්‍රයත්නයන්ට රජයේ සහාය හිමිවනු ඇත. මේ අතර ප්‍රජාවගේ භාෂාවන්, සම්ප්‍රදායන් සහ ආගමික පිළිවෙත් ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීම මෙන්ම ජාතික සංස්කෘතික හා ඓතිහාසික ආඛ්‍යාන තුළ ඔවුන්ගේ සංස්කෘතියේ දෘශ්‍යතාව සහ නියෝජනය ප්‍රවර්ධනය කිරීමේ මුල පිරීම් ඇතුළත්ය.

වතුකර ප්‍රජාවගේ උරුමය සමරන සංස්කෘතික අවස්ථා සහ උත්සව සඳහා මෙන්ම ප්‍රජාවගේ භාෂා විවිධත්වය සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගත් භාෂා සංරක්ෂණ වැඩසටහන් සඳහා රජයේ අරමුදල් සහ සහාය හිමිවනු ඇත. වතුකර ප්‍රජාව විසින් කතා කරන දමිළ සහ අනෙකුත් භාෂා භාවිතය සහ ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීමේ මුලපිරීම් මෙන්ම වාචික ඉතිහාස, ජනප්‍රවාද සහ වෙනත් සංස්කෘතික සම්ප්‍රදායන් ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීමේ ප්‍රයත්නයන් ද මීට ඇතුළත්ය.

14 පරිච්ඡේදය

*පූර්ණ පුරවැසිභාවය සඳහා පිළිගැනීම ලබාදීම සහ ප්‍රකාශයට පත් කිරීම*

**ශ්‍රී ලංකා රජය** වතුකර ප්‍රජාවගේ පූර්ණ පුරවැසි හිමිකම් පිළිගැනීම සහ සහතික කිරීම සඳහා දරන කැපවීම **තහවුරු කර සිටියි.**

වතුකර ප්‍රජාව ශ්‍රී ලාංකීය සමාජයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස **පිළිගැනීමට** මෙන්ම ඔවුන් පූර්ණ වශයෙන් සමාජය වෙත ඒකාබද්ධ කිරීමට සහ සවි බල ගැන්වීමට රජය කැපවී සිටියි.

වතුකර ප්‍රජාව ඓතිහාසික වශයෙන් ආන්තික කරණයට ලක්වීම සහ ඔවුන් මෙරට සමාජ, ආර්ථික සහ දේශපාලනික ජීවිතය වෙත පූර්ණ සහභාගීත්වයක් ලබා නොගෙන සිටීම **රජය විසින් හඳුනා ගෙන තිබේ.** මෙම අයුක්තිසහගත ක්‍රියාදාමය නිවැරදි කිරීමට සහ වතුකර ප්‍රජාව පුරවැසියකුට හිමිවිය යුතු සියලු හිමිකම් හා වරප්‍රසාද සහිත ශ්‍රී ලංකාවේ පූර්ණ පුරවැසිතාවය හා ගරුත්වය හිමි ප්‍රජාවක් බව පිළිගන්නා බවට සහතික කිරීමට රජය කැපවී සිටියි.

පුරවැසි භාවයට, ඉඩම් හා දේපළවලට හිමිකම් කීමට ඇති අයිතිය, ගුණාත්මක අධ්‍යාපනයක් හා සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිය, ජාතික ආර්ථිකයට සහභාගි වීමට ඇති අයිතිය සහ සුරාකෑම් සහ වෙනස්කොට සැලකීම් වලින් ආරක්ෂාව ලැබීමට ඇති අයිතිය ඇතුළත් බව **රජය නැවත වරක් තහවුරු කර සිටියි.** මෙකී හිමිකම් පූර්ණ වශයෙන් ලබාදෙන බව හා අනෙකුත් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් මෙන් වතුකර ප්‍රජාවට ද සමාන අවස්ථා සහ ආරක්ෂාවන් හිමිවන බව සහතික කිරීමට රජය කටයුතු කරනු ඇත.

පුරවැසිභාවය යනු හුදෙක් අයිතිවාසිකම් සහ වරප්‍රසාද පමණක් නොවන අතර සහභාගීත්වය හා අයිතියේ හැඟීම ද මීට අයත් බව **රජය විසින් හඳුනාගෙන තිබේ.** ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවයේ අත්‍යාවශ්‍ය කොටසක් සේ සැලකෙන පොහොසත් ඉතිහාසයකට සහ සංස්කෘතියකට වතුකර ප්‍රජාව හිමිකම් කියන අතර එකී උරුමය පිළිගැනීමට ලක්වන හා සැමරීමට ලක්වන බව සහතික කිරීමට රජය කැපවී සිටියි. වතුකර ප්‍රජාව මෙරට සමාජීය හා සංස්කෘතික ජීවිතයට පූර්ණ වශයෙන්ම ඒකාබද්ධ වන බව සහතික කිරීමට රජය කටයුතු කරනු ඇති අතර ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායකවීමට සහ එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට ඔවුනට අවස්ථාව ලබා දීම සහතික කිරීමට කටයුතු කරනු ඇත.

**මෙලෙස පිළිගැනීමට ලක් කිරීම සහ පුරවැසිභාවය ප්‍රකාශයට පත් කිරීම** වතුකර ප්‍රජාව කෙරෙහි රජය දරන කැපවීමේ තීරණාත්මක අංගයකි. මෙය යුක්තිය. සමානාත්මතාවය සහ පරිපූර්ණ භාවය වෙනුවෙන් රජය දරන කැපවීම පිළිබඳ ප්‍රකාශයකි. එමෙන්ම වතුකර ප්‍රජාවට හිමිවිය යුතු ගරුත්වය හා සාධාරණත්වය ලබා දෙමින් ඔවුන්ගේ අභිමානය සහ මනුෂ්‍යත්වය පිළිගැනීමට ලක්කිරීම පිළිබඳ ප්‍රකාශයකි.

වතුකර ප්‍රජාව උදෙසා වූ මෙම ප්‍රකාශය යථාර්ථයක් බවට පත් කිරීම සහතික කිරීමට රජය කැපවී සිටියි.

**නිගමනය**

කඳුකරයේ වෙසෙන වතුකර ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන රජයේ වැඩපිළිවෙළ සහ රජය ඒ වෙනුවෙන් දක්වන කැපවීම නියෝජනය කරන පදනම් ලේඛනයක් ලෙස මෙම ප්‍රඥප්තිය සම්පාදනය කර ඇත. මෙමගින එම ප්‍රජාව මුහුණ දෙනු ලබන අභියෝග වලට විසඳුම් සෙවීම සහ ශ්‍රී ලාංකීය සමාජය තුළ ඔවුන්ගේ පූර්ණ සහභාගීත්වය සහතික කිරීමට පුළුල් රාමුවක් සකස් කරනු ලබයි.

මෙම ප්‍රඥප්තිය වතුකර ප්‍රජාවගේ සහ ශ්‍රී ලංකා ඉතිහාසයේ නව පරිච්ඡේදයක ආරම්භයයි. වඩාත් සාධාරණ, යුක්තිසහගත සහ පරිපූර්ණ භාවයෙන් යුතු සමාජයක් බිහි කිරීම උදෙසා සියලු පාර්ශ්වකරුවන් එකට එක් වී කටයුතු කරන මෙන් මෙම ප්‍රඥප්තිය ඉල්ලා සිටියි. මෙකී ප්‍රයත්නයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා නායකත්වය සැපයීමට රජය කැපවී සිටින නමුත් ඒ සඳහා වතුකර ප්‍රජාව, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශය, සංවර්ධන හවුල්කරුවන් සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ සක්‍රීය සහභාගීත්වය සහ සහයෝගය අවශ්‍ය වේ. ඒ අනුව මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා එක්ව කටයුතු කරන මෙන් රජය සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජය සහ වතුකර ප්‍රජාව ආදී සියලුම පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටියි.

මෙම ප්‍රඥප්තිය සම්පාදනය කිරීම සඳහා පාදකවන යුක්තිය, සමානාත්මතාවය සහ පරිපූර්ණ භාවය ආදී මූලධර්මවලට සහ වතුකර ප්‍රජාව කෙරෙහි දක්වන කැපවීම රජය නැවත වරක් තහවුරු කරනු ලබයි. වතුකර ප්‍රජාව ශ්‍රී ලාංකීය සමාජයට පූර්ණ වශයෙන් ඒකාබද්ධ කිරීම සහතික කිරීම සහ ඔවුනට මෙරට සංවර්ධනයට දායක වීමට සහ එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට අවස්ථාව සැලසීම ද මින් අදිටන් කරනු ලබයි.

එකී කැපවීම සඳහා දරන සාක්ෂියක් ලෙස මෙන්ම එකී කැපවීම් සාක්ෂාත් කර ගැනීම උදෙසා සකස් වූ මාර්ග සිතියමක් ලෙස මෙම ප්‍රඥප්තිය සම්පාදනය කර ඇත.

EOG 09-0162